PGIHS
UNIVERSITY OF PERADENIYA

# වාර්ෂික වාර්තාව
# ஆண்டறிக்கை
# ANNUAL REPORT

# 2022

මානවශාස්ත්‍ර සහ සමාජීය විද්‍යා පශ්චාත් උපාධි ආයතනය
පේරාදෙණිය විශ්වවිද්‍යාලය
மனிதப் பண்பியல் மற்றும் சமூக விஞ்ஞானக் கற்கைகளுக்கான பட்ட மேற்படிப்பு நிறுவகம்
பேராதனைப் பல்கலைக்கழகம்
**Postgraduate Institute of Humanities and Social Sciences**
**University of Peradeniya**

## දැක්ම

මානවශාස්ත්‍ර හා සමාජීය විද්‍යා ක්ෂේත්‍රය තුළ පශ්චාත් උපාධි අධ්‍යාපනයේ පර්යේෂණ හා තාර්කික චින්තනයේ මෙරට පුරෝගාමියා වීම සහ ඉගෙනුම් ක්ෂේත්‍රයේ කළාපයේ විශිෂ්ඨයා බවට පත්වීම

## මෙහෙවර

සිය ක්ෂේත්‍රය පිළිබඳ දැනුම, කුසලතාවය සහ ප්‍රවීණත්වයෙන් සපිරි සමාජ සංවේදි වූ විද්වතුන්, පර්යේෂකයින් සහ වෘත්තිකයන් බිහිකිරිමේ අරමුණින් යුක්තව ගුණාත්මකභාවයෙන් යුතු උපාධි අධ්‍යාපනයක් පිරිනැමීම


## හර පද්ධතීන්

- සම අවස්ථා
- ශාස්ත්‍රිය සමායෝජනය සහ වෘත්තීයභාවය
- තාර්කික ලෙස දැනුම ලබාගැනීම
- සමාජ සංවේදිභාවය සහ අන්‍යෝන්‍ය ගරුත්වය
- විවිධත්වය සහ අදහස් ප්‍රකාශකිරීමේ නිදහසට ගරුකිරීම
- ප්‍රජාතන්ත්‍රවාදි පාලනය සහ අදහස් ප්‍රකාශකිරීමේ නිදහසට ගරුකිරීම

අන්තර්ගතය


| | | පිටු අංක |
|---|---|---|
| සංවිධාන ව්‍යුහය | | 1 |
| කළමනාකරණ මණ්ඩලයේ සංයුතිය | | 3 |
| 1 වෙනි කොටස: | 2022 වර්ෂය සඳහා ආයතනයේ අධ්‍යක්ෂවරයාගේ ප්‍රකාශය/ සමාලෝචනය | 5 |
| 2 වෙනි කොටස: | ආයතනයේ පසුබිම | 7 |
| 3 වෙනි කොටස: | ශිෂ්‍යයින් බඳවාගැනීම | 9 |
| 4 වෙනි කොටස: | විදේශ සිසුන් බඳවා ගැනීම | 11 |
| 5 වෙනි කොටස: | පාඨමාලා සම්පූර්ණ කිරීම | 12 |
| 6 වෙනි කොටස: | අධ්‍යයන කාර්ය මණ්ඩලය | 13 |
| 7 වෙනි කොටස: | සේවක වර්ගීකරණය | 14 |
| 8 වෙනි කොටස: | පර්යේෂණ ප්‍රකාශන සහ ඉදිරිපත් කිරීම් | 14 |
| 9 වෙනි කොටස: | සාමාන්‍ය උපාධි ප්‍රදානෝත්සවය සහ ඩිප්ලෝමා ප්‍රදානෝත්සවය | 19 |
| 10 වෙනි කොටස: | ධාරිතා සංවර්ධනය | 19 |
| 11 වෙනි කොටස: | තිරසාර සංවර්ධනය මත පදනම් වූ අනාගත අපේක්ෂිත වාර්තාව | 20 |
| 12 වෙනි කොටස: | දේශීය විදේශීය සහයෝගිතාවය | 20 |
| 13 වෙනි කොටස: | සාමාන්‍ය පරිපාලනය | 22 |
| 14 වෙනි කොටස: | මූල්‍ය කාර්යසාධනය | 22 |
| 15 වෙනි කොටස: | විභවතා සහ අපේක්ෂා | 25 |
| ඇමුණුම 1: | 2022 වර්ෂය සඳහා විගණකාධිපතිගේ වාර්තාව | 26 |
| ඇමුණුම 2: | විගණකාධිපතිගේ වාර්තාව සඳහා ලබාදුන් පිළිතුර | 33 |
| ඇමුණුම 3: | 2022 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය පිළිබඳ ගිවිසුම් ප්‍රකාශය | Note 1 |
| ඇමුණුම 4: | මූල්‍ය ප්‍රකාශනය සඳහා සටහන් | Note 12 |

# සංවිධාන ව්‍යුහය


වි.වි.ප්‍ර.කො.
පාලක සභාව
සනාතන සභාව
අධ්‍යක්ෂ
කළමණාකරණ මණ්ඩලය
අභ්‍යන්තර සහ රජයේ විගණන අංශ
පරිපාලන කළමනාකරණ කාර්යාලය
අධ්‍යයන මණ්ඩලය
මූල්‍ය කළමනාකරණ කාර්යාලය
අධ්‍යයන වැඩසටහන් කළමනාකරණ කාර්යාලය

## කළමණාකරණ මණ්ඩලයේ සංයුතිය (2022 දෙසැම්බර් 31 දිනට)

| අනු අංකය | සාමාජිකයාගේ නම | සම්බන්ධතාවය | සාමාජිකත්වය |
|---|---|---|---|
| 01 | මහාචාර්ය එස්.ජේ.එස් ද මෙල් | අධ්‍යක්ෂ/ මානවශාස්ත්‍ර සහ සමාජීය විද්‍යා පශ්චාත් උපාධි ආයතනය | නිල බලයෙන් (සභාපති) |
| 02 | ආචාර්ය ඊ.එම්.පී.සී.එස්. ඒකනායක | පීඨාධිපති/ ශාස්ත්‍ර පීඨය පේරාදෙණිය විශ්වවිද්‍යාලය | නිල බලයෙන් |
| 03 | මහාචාර්ය එස්.ආර්. කොඩිතුවක්කු | පීඨාධිපති/ විද්‍යා පීඨය පේරාදෙණිය විශ්වවිද්‍යාලය | නිල බලයෙන් |
| 04 | මහාචාර්ය කේ.ඒ.එස්.එස්. කොඩිතුවක්කු | පීඨාධිපති/ කෘෂිකර්ම පීඨය පේරාදෙණිය විශ්වවිද්‍යාලය | නිල බලයෙන් |
| 05 | ඩබ්.කේ.එල්.ඊ. වලල්ලාවිට මහතා | උසස් අධ්‍යාපන හා මහා මාර්ග අමාත්‍යාංශය | නම් කරන ලද |
| 06 | එච්. සමරසිංහ මිය | මුදල් අමාත්‍යාංශය | නම් කරන ලද |
| 07 | අධ්‍යක්ෂ | මානව ශාස්ත්‍ර හා සමාජීව විද්‍යා උසස් අධ්‍යයන ජාතික මධ්‍යස්ථානය | නිල බලයෙන් |
| 08 | අධ්‍යක්ෂ/පර්යේෂණ | පේරාදෙණිය විශ්වවිද්‍යාලය | නිල බලයෙන් |
| 09 | එම්.ඒ.එම්. යාසීර් මහතා | අංශ ප්‍රධානී/ අරාබි හා ඉස්ලාම් ශිෂ්ටාචාර අධ්‍යනාංශය, පේරාදෙණිය විශ්වවිද්‍යාලය | නිල බලයෙන් |
| 10 | මහාචාර්ය ජේ.එම්. ආනන්ද ජයවික්‍රම | අංශ ප්‍රධානී/ පුරාවිද්‍යා අධ්‍යනාංශය, පේරාදෙණිය විශ්වවිද්‍යාලය | නිල බලයෙන් |
| 11 | කේ.එම්.ආර්.එන්. කුලතුංග මිය | අංශාධිපති/ ශාස්ත්‍රීය භාෂා අධ්‍යනාංශය, පේරාදෙණිය විශ්වවිද්‍යාලය | නිල බලයෙන් |
| 12 | මහාචාර්ය එච්.එම්.ඩබ්.ඒ. හේරත් | අංශාධිපති/ ආර්ථික විද්‍යා හා සංඛ්‍යාන අධ්‍යනාංශය, පේරාදෙණිය විශ්වවිද්‍යාලය | නිල බලයෙන් |
| 13 | ආචාර්ය කේ.එස්.එච්. එම්.වී.ඩබ්. ඩබ්. සෙනෙවිරත්න | අංශාධිපති/ අධ්‍යාපන විද්‍යා අධ්‍යනාංශය, පේරාදෙණිය විශ්වවිද්‍යාලය | නිල බලයෙන් |
| 14 | ආචාර්ය එම්. කළුගම්පිටිය | අංශාධිපති/ ඉංග්‍රීසි අධ්‍යනාංශය, පේරාදෙණිය විශ්වවිද්‍යාලය | නිල බලයෙන් |
| 15 | ආචාර්ය එස්. මන්තිලක | අංශාධිපති/ ලලිත කලා අධ්‍යනාංශය, පේරාදෙණිය විශ්වවිද්‍යාලය | නිල බලයෙන් |
| 16 | මහාචාර්ය කේ.ඩබ්.ජී.ආර්. නියන්ති | අංශාධිපති/ භූගෝල විද්‍යා අධ්‍යනාංශය, පේරාදෙණිය විශ්වවිද්‍යාලය | නිල බලයෙන් |
| 17 | ආචාර්ය කේ.එම්.ආර්. දසනායක | අංශාධිපති/ ඉතිහාස අධ්‍යනාංශය පේරාදෙණිය විශ්වවිද්‍යාලය | නිල බලයෙන් |
| 18 | ආචාර්ය ඩී. උඩගම | අංශාධිපති/ නීති පීඨය අධ්‍යනාංශය පේරාදෙණිය විශ්වවිද්‍යාලය | නිල බලයෙන් |
| 19 | මහාචාර්ය කේ. රාහුල හිමි | අංශාධිපති/ පාලි හා බෞද්ධ අධ්‍යනාංශය පේරාදෙණිය විශ්වවිද්‍යාලය | නිල බලයෙන් |
| 20 | මහාචාර්ය පී.එම්. ජමාහිර් | අංශාධිපති/ දර්ශන විද්‍යා අධ්‍යනාංශය පේරාදෙණිය විශ්වවිද්‍යාලය | නිල බලයෙන් |

| | | | |
|---|---|---|---|
| 21 | මහාචාර්ය ජී.ඩී.ආර්.යූ.යූ. අබේරත්න | අංශාධිපති/ දේශපාලන විද්‍යා අධ්‍යනාංශය, පේරාදණිය විශ්වවිද්‍යාලය | නිල බලයෙන් |
| 22 | එස්.කේ.එම්.ඩී.ඩී ගුණතිලක | අංශ ප්‍රධානී/ සිංහල අධ්‍යනාංශය පේරාදණිය විශ්වවිද්‍යාලය | නිල බලයෙන් |
| 23 | ආචාර්ය ඩබ්.එම්.එස්.එම්.කේ. තෝරදෙණිය | අංශ ප්‍රධානී/ සමාජ විද්‍යා අධ්‍යනාංශය පේරාදණිය විශ්වවිද්‍යාලය | නිල බලයෙන් |
| 24 | මහාචාර්ය එස්. පිරශාන්තන් | අංශ ප්‍රධානී/ දෙමළ අධ්‍යනාංශය පේරාදණිය විශ්වවිද්‍යාලය | නිල බලයෙන් |
| 25 | ආචාර්ය ජී.ආර්.කේ. දිසානායක | අංශ ප්‍රධානී/ මනෝවිද්‍යා අධ්‍යනාංශය පේරාදණිය විශ්වවිද්‍යාලය | නිල බලයෙන් |
| 26 | මහාචාර්ය ඒ. සර්ජුන් | සභාපති, සමාජ විද්‍යා අධ්‍යයන මණ්ඩලය | නිල බලයෙන් |
| 27 | ආචාර්ය ඩබ්.ඩී.එස්.කේ. ප්‍රේමසිරි | සභාපති, භාෂා හා සාහිත්‍ය අධ්‍යක්ෂක මණ්ඩලය | නිල බලයෙන් |
| 28 | ආචාර්ය එස්.එස්.කේ.බී.එම්. දොරබාවිල | සභාපති, ආර්ථික විද්‍යා හා කළමණාකරණ අධ්‍යයන මණ්ඩලය | නිල බලයෙන් |
| 29 | මහාචාර්ය පී. සේතුංග | සභාපති, මනෝවිද්‍යා, දර්ශන විද්‍යා හා අධ්‍යාපන අධ්‍යයන මණ්ඩලය | නිල බලයෙන් |
| 30 | මහාචාර්ය එම්. ඥාණානන්ද හිමි | සභාපකි, ආගමික සහ සංස්කෘතික අධ්‍යයන අධ්‍යක්ෂ මණ්ඩලය | නිල බලයෙන් |
| 31 | ආචාර්ය වී. නානායක්කාර | විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පත්කරන ලද සාමාජික | පත් කරන ලද |
| 32 | ආචාර්ය ජේ.එම්.ගුණදාස | ආයතනයේ කළමනාකරණ මණ්ඩලය විසින් පත් කරන ලද සාමාජික | පත් කරන ලද |
| 33 | මහාචාර්ය ඩී.පී. ප්‍රේමසිරි | ආයතනයේ කළමනාකරණ මණ්ඩලය විසින් පත් කරන ලද සාමාජික | පත් කරන ලද |
| 34 | මහාචාර්ය කේ.ටී. සිල්වා | ආයතනයේ කළමනාකරණ මණ්ඩලය විසින් පත් කරන ලද සාමාජික | පත් කරන ලද |

| 1 කොටස | 2022 වර්ෂය සඳහා ආයතනයේ අධ්‍යක්ෂවරයාගේ ප්‍රකාශය/සමාලෝචනය |
|---|---|



මානවශාස්ත්‍ර හා සමාජීය විද්‍යා ක්ෂේත්‍රයට අදාළව උසස් අධ්‍යාපනය සහ පුහුණු ලබාදීම මෙන්ම එම ක්ෂේත්‍රයේ පර්යේෂණ වැඩිදියුණු කිරීම සඳහා මානවශාස්ත්‍ර හා සමාජීය විද්‍යා පශ්චාත් උපාධි ආයතනය 1978 අංක 16 දරණ විශ්වවිද්‍යාල පනතේ 24 වගන්තිය යටතේ විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් සකස් කරන ලද ආඥාපනතක් මගින් උසස් අධ්‍යාපන අමාත්‍යාංශය විසින් 2014 වසරේදී ස්ථාපිත කරන ලදි. මානවශාස්ත්‍ර හා සමාජීය විද්‍යා ක්ෂේත්‍රයේ අධ්‍යාපනය, පර්යේෂණ හා නිර්මාණශීලි චින්තනය පිළිබඳ විශිෂ්ට මධ්‍යස්ථානයක් බවට පත් වෙමින් සමාජ මෙහෙවර පිළිබඳ සංවේදීතාවයකින් හෙබි විචාරශීලි හා නිදහස් චින්තනය තුළින් දැනුම ප්‍රගුණ කිරීමට කැපවූ විද්වතුන් බිහිකිරීම මෙම ආයතනයේ අරමුණ වේ.

වර්තමානයේ දී මෙම ආයතනය ශාස්ත්‍රපති හා පශ්චාත් උපාධි පාඨමාලාද දර්ශනපති හා දර්ශනශූරි වැනි පර්යේෂණ උපාධි පාඨමාලාද පවත්වනු ලබයි. ඉහත පාඨමාලාවන්ට අරාබි, ගිණුම්කරණය, පුරාවිද්‍යාව, බෞද්ධ අධ්‍යයනය, ආර්ථික විද්‍යාව, අධ්‍යාපන, ශාරීරික අධ්‍යාපන, ඉංග්‍රීසි භාෂාව, ලලිත කලාව, භූගෝල විද්‍යාව, ග්‍රීක හා රෝම අධ්‍යයනය, හින්දු ශිෂ්ටාචාරය, ඉතිහාසය, ඉස්ලාම් ශිෂ්ටාචාරය, නීතිය, කළමනාකරණය, පාලි භාෂාව, දර්ශනය, දේශපාලන විද්‍යාව, මනෝ විද්‍යාව, සංස්කෘත, සිංහල භාෂාව, සමාජ විද්‍යාව හා දෙමළ භාෂාව යන විෂය ක්ෂේත්‍ර ඇතුළත් වේ මීට අමතරව ආයතනය මඟින් වර්තමානය වන විට සංවර්ධන ක්‍රියාමාර්ග, ජාත්‍යන්තර සබඳතා, තිරසාර සංචාරක කර්මාන්තය, මානව හිමිකම් සහ බහු සංස්කෘතික, සමාජ කටයුතු, පරිසර කළමනාකරණය සහ ප්‍රජා සංවර්ධන සහ සැලසුම් යන විෂය ක්ෂේත්‍ර සඳහා නව පශ්චාත් උපාධි ඩිප්ලෝමා හා ශ්‍රාස්ත්‍රපති උපාධි වැඩසටහන් හඳුන්වා දී ඇත. ආයතනය විසින් ශ්‍රම බලකායේ දක්ෂතා දියුණු කිරීම සඳහා ව්‍යවහාරික භූගෝලීය තොරතුරු පද්ධති පිළිබඳ සහතිකපත් පාඨමාලාව, කෙටිකාලීන පුහුණු වැඩසටහනක් ලෙස හඳුන්වා දී ඇත.

2021/22 වසරේ සියලුම පශ්චාත් උපාධි වැඩසටහන් සඳහා බඳවා ගත් සිසුන් සංඛ්‍යාව 874කි. බාහිර ඉගැන්වීම් හා අධීක්ෂණ කාර්ය මණ්ඩලය ලෙස සුදුසුකම්ලත් සම්පත්දායක පුද්ගලයෝ 180ක් පමණ කාර්යයන්හි නියැලෙන අතර ඔවුන්ගෙන් වැඩි දෙනෙක් ශාස්ත්‍ර පීඨයේ සම්පත් දායකයන් වේ. 2021 දෙසැම්බර් මාසයෙන් ආරම්භ වූ අධ්‍යයන වර්ෂය රට තුළ උද්ගතව පැවති වසංගතය ව්‍යාපෘති අභියෝග මධ්‍යයේ වුවද 2022 වසර අවසානයත් සමඟ සාර්ථකව අවසන් කිරීමට හැකි වූ බව සතුටින් දැනුම් දෙනු කැමැත්තෙමි. 2022 අධ්‍යයන වර්ෂයේ දී සිසුන් 300 කට වැඩි සංඛ්‍යාවක් ආයතනයේ පශ්චාත් උපාධි වැඩසටහන් සම්පූර්ණ කළහ. කෙසේ හෝ එම අභියෝග හමුවේ අධ්‍යයන වර්ෂය නියමිත කාලය තුළ නියමිත පරිදි අවසන් කිරීමට අපට හැකි විය. ශ්‍රී ලංකාවේ පශ්චාත් උපාධි අධ්‍යාපන ආයතනයේ පුරෝගාමියෙකු ලෙස 2022 වසරේ සිසුන් සඳහා අධ්‍යාපන ශාස්ත්‍රපති (MEd) උපාධි වැඩසටහනක් ප්‍රදානය කිරීමට අප ආයතනයට හැකි විය. අධ්‍යාපනය පිළිබඳ දර්ශනපති උපාධියේ 2 වන කණ්ඩායම ලෙස සිසුන් 89 දෙනෙකු බඳවා ගනිමින් අධ්‍යාපනය පුළුල් කිරීමට හැකිවීම මෙම වසරේ අප ලද තවත් ජයග්‍රහණයකි. අධ්‍යාපන පශ්චාත් උපාධි ඩිප්ලෝමා (PGDE) නව කණ්ඩායමට සිසුන් 765ක් බඳවාගත් අතර පළමු වරට අධ්‍යාපන පශ්චාත් උපාධි ඩිප්ලෝමාව (PGDE) යටතේ ලියාපදිංචි වූ අපගේ සිසුන්ට දෙමළ මාධ්‍ය පිරිනැමීමට අපට හැකි විය. ඒ අනුව 2022 වසරේ සිට අපගේ සිසුන්ට භාෂා තුනෙන්ම අධ්‍යාපන කටයුතු කරගෙන යාමට අපි අවස්ථාව සලසා දී ඇත.

2022 ආරම්භයේ දී රට තුළ ආර්ථික අර්බුදයක් පැවතිය ද, ආයතනය එහි සාමාන්‍ය පරිපාලන මෙහෙයුම් විධිමත් කිරීම් හා ශක්තිමත් කිරීම් අඛණ්ඩව සිදු කරන ලදී. අතිරේක කාර්යමණ්ඩලය බඳවාගැනීම මඟින් ආයතනයේ කාර්ය මණ්ඩලයට වගකීම් පැවරීම, ඔවුන්ගේ කාර්යයන් අධීක්ෂණය හා පරීක්ෂා කිරීම වැනි කටයුතු සාර්ථකව සිදුකරමින් පරිපාලන සහ මූල්‍ය කාර්යාලවල කාර්යයන් සංවිධිත කරන ලදි. 2022 වර්ෂය තුළ රටේ උද්ගතව පැවති කෝවිඩ්-19 වසංගත තත්ත්වය හමුවේ වුවද මාර්ගගත ක්‍රමෝපායන් භාවිත කරමින් අධ්‍යාපන කටයුතු අඛණ්ඩව කරගෙන යාම සඳහා පන්ති කාමර හා කාර්යාල සඳහා අවශ්‍ය උපකරණ සහ ලීබඩු ආදිය මිලදී ගැනීම හරහා ආයතනය සිය මෙහෙයුම් පුළුල්

කළේය. ආයතනයේ සංයුක්ත සැලසුම පාදක කරගෙන ක්‍රියාකාරකම් සැලසුම් කිරීම, අතුරු ව්‍යවස්ථා, පර්යේෂණ ප්‍රතිපත්ති හා රෙගුලාසි හා මාර්ගෝපදේශ සකස් කිරීම ද ධාරිතා සංවර්ධන සැලසුමට ඇතුළත් විය.

2022 වර්ෂයේ එහි කාර්ය සාධනය සහ මෙහෙයුම් කළමනාකරණය මත පදනම්ව, ශ්‍රී ලංකා විගණකාධිපතිවරයා විසින් 2022 වසරේ ආයතනයේ මෙහෙයුම්, මූල්‍ය සහ ගිණුම් සඳහා තත්ත්වාගණනය කළ මතයක් ඉදිරිපත් කරන ලදී. කෙසේ වෙතත් ආයතනය වැඩිදුරටත් එහි මෙහෙයුම් ක්‍රියා පටිපාටිවල වෙනස්කම් සිදුකොට දුර්වල අංශ දියුණු කිරීමටත් අත්කරගත් තත්ත්වය තහවුරු කරගැනීමටත් කටයුතු කරන අතර 2023 වසර වන විට සත්‍ය සහ සාධාරණ (සාක්ෂාත් කරගත හැකි හොඳම විගණන මතය) වෙත යාමට අපි බලාපොරොත්තු වෙමු.

2022 වසරේදී පැවති කෝවිඩ් වසංගත ව්‍යාප්ති බාධාවන් හමුවේ වුවද ආයතනය සිය පර්යේෂණ ශක්‍යතාව සහ ප්‍රතිඵල වැඩිදියුණු කිරීමට සහ ඉහළ නැංවීමට කටයුතු කරගෙන ගියේය. අප ආයතනය මඟින් සිසුන්ට විශාල පිටිවහලක් සපයන පර්යේෂණ සම්මේලනයේ (පස්වන පර්යේෂණ සම්මේලනය) 2022 දෙසැම්බර් 16 වැනි දින ආයතනයේ ශ්‍රවණාගාරයේදී සාර්ථකව පවත්වන ලදී. මේ සඳහා සිසුන් 60කට අධික ප්‍රමාණයක් තම වියුක්ත ඉදිරිපත් කරන ලදී- පළමු වරට අපගේ පර්යේෂණ කටයුතු සඳහා ISSN (ජාත්‍යන්තර සම්මත අනුක්‍රමික අංකය) ලබා ගැනීමට අපට හැකි වූ අතර එයට වැඩි වටිනාකමක් එක් කිරීමට ඒ හරහා අපට හැකි විය. 2022 වර්ෂයේදී, ආයතනය විදේශ විශ්වවිද්‍යාල සහ ආයතන සහ අමාත්‍යාංශ, දෙපාර්තමේන්තු සහ රාජ්‍ය හා පෞද්ගලික ආයතන වැනි පළාත් පාලන ආයතන සමඟ සිය සහයෝගිතාව අඛණ්ඩව පවත්වාගෙන ගියේය. විදේශීය ආයතන සමඟ සහයෝගීතාවය ශිෂ්‍ය හා කාර්ය මණ්ඩල හුවමාරු සහ ඒකාබද්ධ පර්යේෂණ ව්‍යාපෘති සඳහා අවස්ථාවන් සපයයි.

ආයතනය එහි පරිපාලන හා මුදල් කළමනාකරණය, වැඩසටහන් පැවැත්වීම, අධ්‍යයන හා පර්යේෂණ සංවර්ධනය, ධාරිතා සංවර්ධය හා ආයතනයේ සමස්ත කාර්යසාධනය සම්බන්ධව 2022 වසරේදී ශක්තිමත් ප්‍රගතියක් ලබාගෙන ඇත. මෙලෙස ආයතනයේ මෙහෙයුම් සම්බන්ධව පළමු වසර හය තුළ (2015 වසරේ සිට) අත්කරගත් මෙම ප්‍රගතිය හා අත්දැකීම් මානවශාස්ත්‍ර හා සමාජීය විද්‍යා ක්ෂේත්‍රයේ විශිෂ්ට මධ්‍යස්ථානයක් බවට පත්වීම සඳහා මෙම ආයතනයට ඉඩප්‍රස්ථා උදාකරදෙනු ලබයි.

මහාචාර්ය එස්. ජේ.එස් ද මෙල්
අධ්‍යක්ෂ
මානවශාස්ත්‍ර හා සමාජීය විද්‍යා පශ්චාත් උපාධි ආයතනය

## 2 කොටස ආයතනයේ පසුබිම



මානවශාස්ත්‍ර හා සමාජීය විද්‍යා පශ්චාත් උපාධි ආයතනය, විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් 1978 අංක 16 දරණ විශ්වවිද්‍යාල පනතේ 24 වගන්තිය යටතේ සම්පාදිත, උසස් අධ්‍යාපන අමාත්‍යාංශය මඟින් ස්ථාපනය කරන ලද ජාතික ආයතනයකි. තාර්කික හා නිදහස් චින්තනය තුළින් දැනුම ප්‍රගමනය සඳහා කැපවුණු ස්වකීය සමාජ වගකීම් පිළිබඳ මනා අවබෝධයකින් යුත් විද්වතුන් බිහිකිරීම උදෙසා මානව ශාස්ත්‍ර හා සමාජීය විද්‍යා ක්ෂේත්‍රයේ අධ්‍යාපන, පර්යේෂණ හා නිර්මාණශීලි පරිකල්පනයෙන් හෙබි විශිෂ්ට මධ්‍යස්ථානයක් බවට පත්වීම මෙම ආයතනයේ අරමුණයි.

වර්ෂ 2017 දී ආයතනයේ පදනම සකස් කරමින් එහි ප්‍රථම පස් අවුරුදු සංයුක්ත සැලැස්ම පිළියෙල කරන ලදී. මෙම සංයුක්ත සැලැස්ම මඟින් ප්‍රධාන මෙහෙයුම් ක්ෂේත්‍ර 3ක් යටතේ සපුරාගත යුතු ඉලක්ක 6ක් හඳුනාගෙන ඇත. එය පහත දැක්වෙන ප්‍රධාන මෙහෙයුම් ක්ෂේත්‍ර ත්‍රිත්වය පිළිබඳ අවධානය යොමු කරයි. ඒවා නම් ඉගෙනුම් හා පර්යේෂණ කාර්යාවලියේ ගුණාත්මක බව හා ප්‍රමිතිය වැඩි දියුණු කිරීම, පරිපාලන හා මූල්‍ය කළමනාකරණයේ කාර්යක්ෂමතාව වර්ධනය කිරීම හා මනා පාලනය සහ ආචාරශීලි හැසිරීම ශක්තිමත් කිරීම වේ. 2018-2022 සඳහා වන සංයුක්ත සැලැස්ම මඟින් පහත දැක්වෙන ඉලක්ක 6 යටතේ අරමුණු දහඅටක් සහ උපාය මාර්ග හතළිස් හතරක් ඔස්සේ ක්‍රියාමාර්ග හැත්තෑඅටක් දියත් කිරීමට සැලසුම් කරයි.

- අධ්‍යයන වැඩසටහන්වලට ප්‍රවේශ වීම ඒවායේ ගුණාත්මක බව හා අදාළත්වය දියුණු කිරීම.
- අන්‍යෝන්‍ය වශයෙන් ගරු කිරීම, සමාජ සංවේදීතාවය, ගුණාත්මක ශිෂ්‍යත්ව සහ වෘත්තීයත්වය යන කාරණා මත පදනම්වූ ශිෂ්‍ය කේන්ද්‍රීය ඉගෙනුම් පරිසරයක් නිර්මාණය කිරීම.
- ක්‍රියාශීලී පර්යේෂණ සංස්කෘතියක් සහ දැනුම ව්‍යාප්ත කිරීම සඳහා කාර්යක්ෂම ක්‍රමවේදයක් හඳුන්වා දීම.
- භෞතික යටිතල පහසුකම් සහ සේවා පහසුකම් සංවර්ධනය කිරීම.
- පරිපාලනයේ කාර්යක්ෂමතාවත් මූල්‍ය කළමනාකරණයේ තිරසාර බවත් ළඟා කර ගැනීම සහ
- ආයතනයේ සියළුම කටයුතුවල විනිවිදභාවය සහ යහපැවැත්ම තහවුරු කිරීම.

සංයුක්ත සැලැස්මේ සඳහන් කාර්යයන් සාර්ථකව ක්‍රියාත්මක කිරීම මඟින් ආයතනය මෙරටේ මානවශාස්ත්‍ර සහ සමාජීය විද්‍යා විෂය ක්ෂේත්‍රයට අදාළව පශ්චාත් උපාධි අධ්‍යාපනයේ, පර්යේෂණ සහ නිර්මාණශීලී චින්තනයේ ප්‍රමුඛයා බවට හා කලාපයේ විශිෂ්ට ඉගෙනුම් මධ්‍යස්ථානය බවට පත්වීමට අපේක්ෂා කරයි.

ආයතනය විසින් වර්තමානයේ දී පහත සඳහන් උපාධි පාඨමාලා පවත්වනු ලැබේ.

පශ්චාත් උපාධි ඩිප්ලෝමා
ශාස්ත්‍රපති පාඨමාලා
දර්ශනපති පාඨමාලා
දර්ශනශූරී පාඨමාලා

මානවශාස්ත්‍ර හා සමාජීය විද්‍යා පශ්චාත් උපාධි ආයතනය මඟින් සපයනු ලබන ඉහත පාඨමාලාවන්ට අරාබි, ගණකාධිකරණය, පුරාවිද්‍යාව, බෞද්ධ අධ්‍යයන, ආර්ථික විද්‍යාව, අධ්‍යාපනවේදය, ඉංග්‍රීසි, ලලිත කලා, භූගෝල විද්‍යාව, ග්‍රීක හා රෝමානු අධ්‍යයන, හින්දු ශිෂ්ටාචාරය, ඉතිහාසය, ඉස්ලාම් ශිෂ්ටාචාරය, කළමනාකරණය, පාලි, දර්ශනය, ශාරීරික අධ්‍යාපනය, දේශපාලන විද්‍යාව, මනෝ විද්‍යාව, සංස්කෘත, සිංහල, සමාජ විද්‍යාව, සහ දෙමළ යන විෂයයන් ඇතුළත් වේ.

වර්ෂ 2022 වන විට ආයතනය විසින් පහත දැක්වෙන තේමාගත පශ්චාත් උපාධි පාඨමාලා සහ ශාස්ත්‍රපති උපාධි පාඨමාලා ප්‍රදානය කරනු ලබයි.

- ව්‍යවහාරික ආර්ථික විද්‍යාව පිළිබඳ ශාස්ත්‍රපති උපාධිය
- අධ්‍යාපනපති උපාධිය
- සංවර්ධන ක්‍රියාමාර්ග පිළිබඳ ශාස්ත්‍රපති උපාධිය
- තිරසාර සංචාරක කර්මාන්තය පිළිබඳ විද්‍යාපති උපාධිය
- තිරසාර සංචාරක කර්මාන්තය පිළිබඳ ශාස්ත්‍රපති උපාධිය
- ජාත්‍යයන්තර සබඳතා පිළිබඳ ශාස්ත්‍රපති උපාධිය
- මානව හිමිකම් හා බහුසංස්කෘතිකවාදය පිළිබඳ ශාස්ත්‍රපති උපාධිය
- සමාජ කටයුතු පිළිබඳ ශාස්ත්‍රපති උපාධිය

ප්‍රජා සංවර්ධන හා සැලසුම් පිළිබඳ පශ්චාත් උපාධි ඩිප්ලෝමා වැඩසටහන 2021 දී ආරම්භ කරන ලද අතර 2022 වර්ෂයේ දී සමෘද්ධි දෙපාර්තුමේන්තුව සමඟ ඇති කර ගත් ගිවිසුම ප්‍රකාරව 2022 වසරේ දී මෙම ඩිප්ලෝමා උපාධි පිරිනැමීමට අපට හැකි විය.

අන්තර්විෂයික හා බහුවිෂයික කෂේත්‍ර පිළිබඳ අවධානය යොමු කරමින් දැනට පවතින පාඨමාලාවන්ට හා අලුතෙන් හඳුන්වා දෙන පාඨමාලා ප්‍රවේශයට වැඩි ඉඩ ප්‍රස්තාවක් ලබාදෙමින් ස්වකීය පශ්චාත් උපාධි පාඨමාලාවන් තව දුරටත් පුළුල් කිරීමට හා අවශ්‍ය සංශෝධන සිදු කිරීමට ආයතනය සිය සැලසුම් අඛණ්ඩව යොදාගනු ලබයි. සංයුක්ත සැලැස්මේ හඳුනාගෙන ඇති පරිදි සහ අවශ්‍යතා පැනනඟින පරිදි නව පාඨමාලා සංවර්ධනය කිරීමේ කටයුතුවල ආයතනය අඛණ්ඩව නියැලී සිටී. එමෙන්ම පෞද්ගලික සහ රාජ්‍ය අංශයේ ආයතනවල සහභාගීත්වය ද ඇතිව ශ්‍රම බලකාය උදෙසා කෙටි කාලීන පාඨමාලා පැවැත්වීමේ කාර්යයෙහිද ආයතනය නියැලී සිටී.

| **3 කොටස:** | **ශිෂ්‍යයින් බඳවා ගැනීම** |
|---|---|

2022 දෙසැම්බර් 31 වන විට පශ්චාත් උපාධි ඩිප්ලෝමා සහ උපාධි පාඨමාලා සඳහා ආයතනයෙහි ලියාපදිංචි වූ ශිෂ්‍ය සංඛ්‍යාව 1 සිට 5 දක්වා වගු මඟින් නිරූපණය කරයි. 2022 වර්ෂය තුළදී පශ්චාත් උපාධි පාඨමාලා සහ උපාධි පාඨමාලා සඳහා මෙම ආයතනය ශිෂ්‍යයින් 874ක් ඇතුළත් කරගෙන තිබේ. 2021 වසරට සාපේක්ෂව, 2022 වසරේදී ආයතනයට බඳවා ගන්නා සිසුන් සංඛ්‍යාව 6.6% කින් පහළ ගොස් ඇත.


වගු අංක 1
පාඨමාලා අනුව ශිෂ්‍යයින් බඳවා ගැනීම, 2020 -2022 (දෙසැම්බර් 31 දිනට)

| පාඨමාලාව | 2020 | 2021 | 2022 |
|---|---|---|---|
| සහතික පාඨමාලා | 8 | -- | |
| පශ්චාත් උපාධි ඩිප්ලෝමා පාඨමාලා | 89* | 398 | 768 |
| ශාස්ත්‍රපති පාඨමාලාව | 575 | 361 | 95 |
| දර්ශනපති උපාධි පාඨමාලා | 238 | 149 | 06 |
| දර්ශනශූරී උපාධි පාඨමාලා | 24 | 28 | 05 |
| **මුළු** | **934** | **936** | **874** |

සැ.යු.* අධ්‍යාපනය පිළිබඳ පශ්චාත් උපාධි ඩිප්ලෝමාව (සති අන්ත) නොපවත්වන ලදී.
මූලාශ්‍රය: ලේඛකාධිකාරී කාර්යාලය, මානවශාස්ත්‍ර හා සමාජීය විද්‍යා පශ්චාත් උපාධි ආයතනය.

2021 වසරට සාපේක්ෂව 2022 වර්ෂයේ දී ද අධ්‍යාපන ඇතුළු සියලුම විෂයයන් සඳහා පශ්චාත් උපාධි ඩිප්ලෝමා පාඨමාලා සඳහා වැඩිම සිසුන් සංඛ්‍යාවක් ලියාපදිංචි වී ඇති බව පෙන්නුම් කරන අතර එය 2022 වසරේ සිසුන් බඳවා ගැනීම ඉහළ නැංවීමට ප්‍රධාන වශයෙන් දායක වී ඇත. මෙම වැඩිවීමට හේතුව අධ්‍යාපන පශ්චාත් උපාධි ඩිප්ලෝමාව (PGDE) සඳහා බඳවා ගන්නා සිසුන් සංඛ්‍යාව ඉහළ යාමයි. මෙම වැඩිවීමට හේතු වී ඇත්තේ ශ්‍රී ලංකාවේ රජයේ සේවයේ නියුතු ගුරුවරුන්ගෙන් ඇති ඉහළ ඉල්ලුමයි.

ප්‍රස්තාර අංක 1
පාඨමාලා අනුව සිසුන් ඇතුළත් කර ගැනීමේ ප්‍රතිශත ව්‍යාප්තිය, 2021 සහ 2022




මූලාශ්‍රය: වගු අංක 1 අනුව.

2021 වසර හා සසඳන විට, 2022 වසරේ දී ශාස්ත්‍රපති උපාධි වැඩසටහන, දර්ශනපති උපාධි වැඩසටහන (MPhil) සහ ආචාර්ය උපාධිය (PhD) සඳහා ඇතුළත් වූ සිසුන් සංඛ්‍යාව අඩු වී ඇති අතර 2023 අධ්‍යයන වර්ෂයේදී මෙම පර්යේෂණ සිසුන් සඳහා වැඩමුළු සංවිධානය කිරීමට අපි බලාපොරොත්තු වෙමු.


අධ්‍යයන පාඨමාලා සඳහා ශිෂ්‍යයින් ඇතුළත් කර ගැනීමේ ප්‍රතිශත ව්‍යාප්තිය ප්‍රස්තාර අංක 1 මඟින් පෙන්වන අතර එහි සැලකිය යුතු වෙනසක් 2021 සහ 2022 වසර දෙක අතර සිදුවී ඇත.

වගු අංක 2
සිසුන් ඇතුළත් කර ගැනීම
පාඨමාලා සහ ස්ත්‍රී / පුරුෂ භාවය අනුව, 2020-2022 (දෙසැම්බර් 31 දිනට)

| පාඨමාලාව | 2020 | | 2021 | | 2022 | |
|---|---|---|---|---|---|---|
| | පිරිමි | ගැහැණු | පිරිමි | ගැහැණු | පිරිමි | ගැහැණු |
| සහතික පාඨමාලා | 6 | 2 | - | - | - | - |
| පශ්චාත් උපාධි ඩිප්ලෝමා පාඨමාලා | 36 | 53 | 96 | 302 | 135 | 633 |
| ශාස්ත්‍රපති පාඨමාලාව | 191 | 384 | 83 | 278 | 32 | 63 |
| දර්ශනපති උපාධි පාඨමාලා | 140 | 98 | 80 | 69 | 1 | 5 |
| දර්ශනශූරි උපාධි පාඨමාලා | 10 | 14 | 19 | 9 | 4 | 1 |
| **මුළු** | **383** | **551** | **278** | **658** | **172** | **702** |

මූලාශ්‍රය: ලේඛකාධිකාරී කාර්යාලය, මානවශාස්ත්‍ර හා සමාජීය විද්‍යා පශ්චාත් උපාධි ආයතනය.

ප්‍රස්තාර අංක 2
සිසුන් බඳවා ගැනීම (%) පාඨමාලා සහ ස්ත්‍රී / පුරුෂ භාවය අනුව 2021-2022




මූලාශ්‍රය: වගු අංක 2

වගු අංක 2 මඟින් සහ ප්‍රස්ථාර අංක 2 මගින් 2020 සිට 2022 දක්වා අධ්‍යයන වර්ෂ සඳහා බඳවා ගත් සිසුන් සංඛ්‍යාව හා ඇතුළත් කරගන්නා ලද ශිෂ්‍ය සංඛ්‍යාව ස්ත්‍රී පුරුෂ භාවය අනුව නිරූපණය කරයි. 2022 අධ්‍යයන වර්ෂයේදී, මුළු බඳවාගැනීම්වලින් 19% ක් පුරුෂ විද්‍යාර්ථීන් වූ අතර 81% ක් ස්ත්‍රී විද්‍යාර්ථීන් විය. 2021 අධ්‍යයන වර්ෂය සමඟ සංසන්දනාත්මකව එය පිළිවෙලින් 29% සහ 71% ලෙස වෙනස් වී ඇත. අධ්‍යාපනය සඳහා වූ පශ්චාත් උපාධි සඳහා බඳවා ගත් ශිෂ්‍යාවන් සංඛ්‍යාව ඉහළ යෑම මෙයට ප්‍රධාන වශයෙන් බලපා ඇත. 2020 සහ 2021 වසරවලට සාපේක්ෂව 2022 වසරේ දී අනෙකුත් පශ්චාත් උපාධි පාඨමාලා සඳහා ලියාපදිංචි වූ ස්ත්‍රී පුරුෂ දෙපාර්ශවයම ප්‍රතිශතාත්මක අඩුවීමක් දක්නට ලැබෙන අතර විශේෂයෙන් ම පර්යේෂණ සිසුන් බඳවා ගැනීම් ඉතා ඉහළ ප්‍රතිශතයකින් අඩුවී ඇත. මෙම කාලවකවානුවේ රට තුළ පැවති ආර්ථික අර්බුදකාරී තත්ත්වය මෙලෙස ශිෂ්‍ය ලියාපදිංචිය අඩුවීමට ප්‍රධාන වශයෙන් බලපෑවේය.

වගු අංක 3 මඟින් නිරූපණය කරන්නේ ආයතනයේ අධ්‍යයන මණ්ඩලය විසින් පිරිනමනු ලබන පශ්චාත් උපාධි පාඨමාලා සහ සිසුන් බඳවා ගන්නා අයුරු වේ.

වගු අංක 3
ශිෂ්‍යයින් බඳවා ගැනීම (අධ්‍යයන මණ්ඩල අනුව) 2021-2022 (දෙසැම්බර් 31 දිනට)

| අධ්‍යයන මණ්ඩලය | 2021 | 2022 |
|---|---|---|
| සමාජ විද්‍යාව | 175 | 07 |
| භාෂා සහ සාහිත්‍ය අධ්‍යයනය | 57 | 01 |
| ආර්ථික විද්‍යාව සහ කළමනාකරණය | 117 | 02 |
| මනෝ විද්‍යාව, දර්ශනය සහ අධ්‍යාපනය | 519 | 855 |
| ආගමික හා සංස්කෘතික අධ්‍යයනය | 68 | 09 |
| මුළු | **936** | **874** |

මූලාශ්‍රය: ලේඛකාධිකාරී කාර්යාලය, මානවශාස්ත්‍ර හා සමාජීය විද්‍යා පශ්චාත් උපාධි ආයතනය.

## 4 කොටස විදේශ සිසුන් බඳවා ගැනීම



4 වන වගුව මඟින් පශ්චාත් උපාධි ඩිප්ලෝමා හා උපාධි පාඨමාලා සඳහා මෙම ආයතනයේ ලියාපදිංචි වූ ශිෂ්‍ය සංඛ්‍යාව පෙන්වයි. විදේශ සිසුන්ගෙන් බහුතරයක් පාලි හා බෞද්ධ අධ්‍යයන සම්බන්ධ පශ්චාත් උපාධි පාඨමාලා හා පර්යේෂණ සඳහා වැඩි අවධානයක් දක්වති. වර්ෂ 2022 දී ආයතනය විසින් විදේශ සිසුන් 8 දෙනෙකු ඇතුළත් කරගන්නා ලදී. එය 2021 වසර සසදා බැලීමේ දී එම සංඛ්‍යාව අඩු වී ඇත. මෙම සිසුන් 8 දෙනා පාඨමාලා අතර බෙදීගොස් ඇත්තේ ශාස්ත්‍රපති උපාධිය සඳහා 2ක්, දර්ශනපති උපාධිය සඳහා 3ක් හා දර්ශනශූරී උපාධි සඳහා 4ක් වශයෙනි.

වගු අංක 4
විදේශ සිසුන් බඳවා ගැනීම (පාඨමාලා අනුව) 2020-2022 (දෙසැම්බර් 31 දිනට)

| පාඨමාලාව | 2020 | 2021 | 2022 |
|---|---|---|---|
| පශචාත් උපාධි ඩිප්ලෝමා | 0 | 0 | |
| ශාස්ත්‍රපි උපාධි පාඨමාලා | 9 | 9 | 02 |
| දර්ශනපති උපාධි | 4 | 3 | 02 |
| දර්ශනශූරි උපාධි | 0 | 0 | 04 |
| **එකතුව** | **13** | **12** | **08** |

මූලාශ්‍රයඃ ලේඛකාධිකාරී කාර්යාලය, මානවශාස්ත්‍ර හා සාමාජීය විද්‍යා පශචාත් උපාධි ආයතනය.

## 5 කොටස පාඨමාලා සම්පූර්ණ කිරීම

5 වන වගුව මඟින් 2020 සිට 2022 යන වර්ෂ තුළ උපාධි පාඨමාලා අවසන් කිරීම පිළිබඳ සිසුන් සංඛ්‍යාව පිළිබඳ දත්ත සපයයි. පශ්චාත් උපාධි ඩිප්ලෝමා සිසුන් හැර අනෙකුත් සියලුම පශ්චාත් උපාධි පාඨමාලා සඳහා බඳවා ගන්නා සිසුන් 2022 අධ්‍යයන වර්ෂයේදී සිය උපාධිය සාර්ථකව නිම කිරීමේ ප්‍රතිශතයේ වැඩිවීමක් පෙන්නුම් කරයි. මෙම ආයතනයේ පශ්චාත් උපාධි පාඨමාලා නිම කරන ලද ශිෂ්‍ය සංඛ්‍යාව 2022 වර්ෂය සඳහා 372ක් වූ අතර සිසුන් 100ක් පශ්චාත් උපාධි ඩිප්ලෝමාව ද සිසුන් 256ක් ශාස්ත්‍රපති උපාධි පාඨමාලාව ද සිසුන් 11ක් දර්ශනපති උපාධි පාඨමාලාව ද සිසුන් 5ක් දර්ශනශූරි උපාධි පාඨමාලාව ද සාර්ථකව නිම කරන ලදී.

වගු අංක 5
පාඨමාලා නිම කරන ලද ශිෂ්‍ය සංඛ්‍යා 2020-2022 (දෙසැම්බර් 31 දිනට)

| පාඨමාලා | 2020 | | 2021 | | 2022 | |
|---|---|---|---|---|---|---|
| | සං | % | සං | % | සං | % |
| පශචාත් උපාධි පාඨමාලා | 9 | 4.33 | 429 | 64.90 | 100 | 26.88 |
| ශාස්ත්‍රපති උපාධි /අධ්‍යාපනපති උපාධි/සංවර්ධන ශාස්ත්‍රපති | 178 | 85.58 | 211 | 31.92 | 256 | 68.82 |
| දර්ශනපති උපාධි | 18 | 8.65 | 15 | 2.26 | 11 | 2.96 |
| දර්ශනශූරි උපාධි | 3 | 1.44 | 8 | 1'20 | 05 | 1.34 |
| එකතුව | 208 | 100.00 | 663 | 100.00 | 372 | 100.00 |

මූලාශ්‍රයඃ ලේඛකාධිකාරී කාර්යාලය, මානවශාස්ත්‍ර හා සාමාජීය විද්‍යා පශ්චාත් උපාධි ආයතනය.

අතීතයේ ප්‍රතිඵල නිකුත්කිරීම සඳහා දිගුකාලීනව වූ ප්‍රමාද් වීම්, පාඨමාලා නිම කිරීමට ගතවන කාලය සඳහා මෙන් ම සිසුන්ගේ වෘත්තීය ප්‍රගතිය සඳහාත් අහිතකර ලෙස බලපායි. අධීකෂකයින්ට පැහැදිලි මෙහෙයුම් නිර්ණායක හා උපදෙස් ලබා දීම මඟින් 2018 වසරේ සිට ප්‍රතිඵල නිකුත් කිරීමට ගතවන කාලය අඩු කිරීමට ක්‍රියාමාර්ග ගෙන ඇත. කෙසේ වුවත් ප්‍රතිඵල නිකුත් කිරීම සම්බන්ධයෙන් ඉදිරියේදී වන ප්‍රමාද වීම් අවම කිරීම සඳහා අධීක්ෂණ ක්‍රියාවලිය බලගැන්විය යුතුය.

| 6 කොටස | අධ්‍යයන කාර්යය මණ්ඩලය |
|---|---|


මානවශාස්ත්‍ර සහ සමාජීය විද්‍යා පශ්චාත් උපාධි ආයතනය මඟින් 2022 වර්ෂයේ දී උපාධි පාඨමාලා ලබා දීම සඳහා බාහිර පදනම යටතේ 169 දෙනෙකුගෙන් යුත් අධ්‍යයන කාර්යය මණ්ඩලයක සේවය ලබා ගන්නා ලදී. 6 වන වගුවේ දැක්වෙන පරිදි පශ්චාත් උපාධි මට්ටමේ සුදුසුකම් සහිත මහාචාර්යවරු 50ක්, සහාය මහාචාර්යවරු 73ක්, ජ්‍යෙෂ්ඨ කථිකාචාර්යවරු (1 හා 11 ශ්‍රේණියේ ) 00 ක් සහ කථිකාචාර්යවරු 56ක් මීට ඇතුලත් වේ. බාහිර කාර්ය මණ්ඩලය, පේරාදෙණිය විශ්වවිද්‍යාලයේ ශාස්ත්‍ර පීඨය හා අනෙකුත් පීඨ, ශ්‍රී ලංකාවේ සහ විදෙස් රටවල අනෙකුත් විශ්වවිද්‍යාල, පර්යේෂණ සහ උසස් අධ්‍යාපන ආයතන සහ විශ්‍රාමික ශාස්ත්‍රඥයින්ගෙන් යුක්ත වේ. ඉගැන්වීමේ හා නිබන්ධන අධීක්ෂණයේ යෙදෙන මහාචාර්යවරු සංඛ්‍යාව අධ්‍යයන කටයුතු වල නිරත වන සමස්ත කාර්ය මණ්ඩලයෙන් 29.6% ක් පමණ වේ. තවද ගණනය කිරීම් අනුව සමස්ත බාහිර කාර්ය මණ්ඩලයෙන් 0% ක් ජ්‍යෙෂ්ඨ කථිකාචාර්යවරු වේ. ඉතිරි සංඛ්‍යාව විශේෂයෙන් ම දර්ශනපති උපාධි හෝ ඊට ඉහළ පශ්චාත් උපාධි සහිත විද්වතුන් වේ. සමස්ත බාහිර කාර්ය මණ්ඩලයෙන් 78% ක් පුරුෂ පාර්ශවයෙන් වන අතර 21% ක් ස්ත්‍රී පාර්ශවයෙන් වේ.

වගු අංක 6
ආයතනයේ බාහිර අධ්‍යයන කාර්ය මණ්ඩලය (2022 දෙසැම්බර් 31 දිනට)

| විෂය | මහාචාර්යවරු | | සහාය මහාචාර්යවරු | | ජ්‍යෙෂ්ඨ කථිකාචාර්යවරු | | කථිකාචාර්යවරු | | එකතුව | |
|---|---|---|---|---|---|---|---|---|---|---|
| | පු | ස් | පු | ස් | පු | ස් | පු | ස් | පු | ස් |
| ආයතනයේ අධ්‍යයන හා පශ්චාත් උපාධි පාඨමාලා අධීක්ෂණයේ යෙදෙන කාර්ය මණ්ඩලය | 45 | 5 | 59 | 14 | 00 | 00 | 28 | 18 | 132 | 37 |

මූලාශ්‍රය: ලේඛකාධිකාරී කාර්යාලය, මානවශාස්ත්‍ර හා සමාජීය විද්‍යා පශ්චාත් උපාධි ආයතනය.

ප්‍රස්ථාර අංක 3
බාහිර කාර්ය මණ්ඩලයේ ප්‍රතිශත ව්‍යාප්තිය - 2022




මූලාශ්‍රය: වගු අංංක 6 අනුව

## 7 කොටස සේවක වර්ගීකරණය

මානවශාස්ත්‍ර සහ සමාජීය විද්‍යා පශ්චාත් උපාධි ආයතනය තුළ අනුමත කාර්යය මණ්ඩල තනතුරු 13 ක් පවතින අතර ඊට අධ්‍යක්ෂ, සහකාර ලේඛකාධිකාරි, සහකාර මූල්‍යාධිකාරි, ලඝු ලේඛක, ශ්‍රව්‍ය දෘශ්‍ය තාක්ෂණික නිලධාරි, තාක්ෂණික නිලධාරි, කළමනාකරණ සහකාර තනතුරු 5ක්, සරප්, රියදුරු සහ කම්කරු යන තනතුරු ඇතුළත්ය. 2019 වසර වන විට සියලුම අනුමත මූලික සේවක අවශ්‍යතා සපුරන ලදි. ආයතනයේ කටයුතු විධිමත්ව පවත්වාගෙන යාම සඳහා විගණන හා කළමනාකරණ කමිටු නිර්දේශ මත අතිරේක තනතුරු 15ක අවශ්‍යතාව හඳුනාගෙන ඇත. එම යෝජනාව මුදල් අමාත්‍යාංශයේ අනුමැතිය සඳහා ඉදිරිපත් කර ඇත.

වගු අංක 7
සේවක වර්ගීකරණය (2022 දෙසැම්බර් 31 දිනට)

| සේවා කාණ්ඩය | වැටුප් කේතය | ස්ථිර කාර්ය මණ්ඩලය | | එකතුව |
|---|---|---|---|---|
| | | පිරිමි | ගැහැණු | |
| ***ජ්‍යෙෂ්ඨ මට්ටම*** | | | | |
| මහාචාර්ය / ජ්‍යෙෂ්ඨ මහාචාර්ය | U-AC 5 | 1 | 0 | 1 |
| ***තෘතීයික මට්ටම*** | | | | |
| කනිෂ්ඨ විධායක / කළමනාකරුවන් | U-EX 1 | 2 | 0 | 2 |
| ***ද්විතියික මට්ටම*** | | | | |
| සහකාර නිලධාරීන් - 1 කොටස | U-MN 3 | 0 | 0 | 0 |
| කළමනාකරණ සහකාර - තාක්ෂණික | U-MT 1 | 2 | 0 | 2 |
| කළමනාකරණ සහකාර - තාක්ෂණික නොවන | U-MN 1 | 1 | 5 | 6 |
| ***ප්‍රාථමික මට්ටම*** | | | | |
| ප්‍රාථමික ශ්‍රේණිය - පුහුණු | PL-3 | 1 | 0 | 1 |
| ප්‍රාථමික ශ්‍රේණිය - නුපුහුණු | PL-1 | 3 | 0 | 1 |
| | | | **මුළු** | **15** |

මූලාශ්‍රය: ලේඛකාධිකාරීකාර්යාලය, මානවශාස්ත්‍ර සහ සමාජීය විද්‍යා පශ්චාත්උපාධි ආයතනය

ස්ථිර කාර්ය මණ්ඩලය ප්‍රමාණවත් නොවීම නිසා ආයතනය මගින් උත්පාදිත අරමුදල් යොදාගෙන කොන්ත්‍රාත් පදනම යටතේ සේවකයන් 15 දෙනෙකුගේ සේවය ලබා ගන්නා ලදී. එහි අරමුණ වූයේ රාජකාරි හා වගකීම් ආවරණය කිරීමත් ස්ථිර සේවකයින්ගේ අතිරේක රාජකාරි අවම කිරීමත්ය. මෙම තනතුරුවලට ලිපිකරු සහ අනුබද්ධ කාර්ය මණ්ඩලය සඳහා 13ක් සහ ප්‍රාථමික කාර්ය මණ්ඩලය සඳහා 2 ක් ඇතුළත් වේ.

## 8 කොටස පර්යේෂණ ප්‍රකාශන සහ ඉදිරිපත් කිරීම්

මානවශාස්ත්‍ර හා සමාජීය විද්‍යා ආයතනයේ එක් වැදගත් අරමුණක් වන්නේ සමාජීය විද්‍යා ක්ෂේත්‍රයේ පර්යේෂණ ප්‍රවර්ධනය කිරීම සහ දැනුම ව්‍යාප්ත කිරීමය. වර්තමානය වන විට ආයතනය දර්ශනශූරී, දර්ශනපති හා ශාස්ත්‍රපති පාඨමාලා කාර්යයන් හරහා පර්යේෂණ පාඨමාලා වල නියැලී සිටී. වර්ෂ 2022 දී විද්‍යාර්ථීන් 18ක් විසින් පර්යේෂණ ඉදිරිපත් කර නිම කර ඇති අතර මෙම සම්පූර්ණ කරන ලද නිබන්ධන වලට දර්ශනශූරී නිබන්ධන 47ක් හා දර්ශනපති නිබන්ධන 13ක්ඇතුළත් විය. 8 වෙනි වගුව මගින් දැක්වෙන්නේ නිම කරන ලද නිබන්ධන වලට අදාළ තොරතුරුය.

වගු අංක 8
පර්යේෂණ ප්‍රකාශන සහ ඉදිරිපත් කිරීම , 2022

| විෂය | සම්පූර්ණ කළ/ප්‍රකාශයට පත් කළ | ඉදිරිපත් කළ |
|---|---|---|
| නිබන්ධ | 47 | 47 |
| ලිපි | 13 | 13 |
| වෙනත් | --- | --- |
| එකතුව | 60 | 60 |

මූලාශ්‍රය: ලේඛකාධිකාරී කාර්යාලය, මානවශාස්ත්‍ර සහ සමාජීය විද්‍යා පශ්චාත් උපාධි ආයතනය

වගු අංක 9
2022 වර්ෂයේ සම්පූර්ණ කරන ලද නිබන්ධන වල තොරතුරු

| Name of the Student | Title of the Thesis | Degree | Board of Study |
|---|---|---|---|
| Thakuri YBM Rev. | Dispelling Anger: Study of Anger Management Methods in the Pali Texts | PhD | Religious and Cultural Studies |
| Chun Zhang | A Buddhist Approach to Behavioral Studies: A Theravāda Abhidhammic Response to Classic Conditioning Theory in Behavioral Psychology | PhD | Religious and Cultural Studies |
| Dhammaratana B, Rev. | A Critical Edition of the Kaccāyanacatuttha Tikā and Supplementary to the Kaccāyanacatutta Tikā | PhD | Religious and Cultural Studies |
| Sarananda P, Rev. | 'Daskonappamila' The Pali Great Poem | PhD | Religious and Cultural Studies |
| Anushanthan, E | The Influence of Thiruvasagam in Sri Lankan Hindu Culture Growth | PhD | Religious and Cultural Studies |
| Tilakawardana, S | The Impact of Digital Convergence and Social Media on Social Awareness: A Study of the Sri Lankan YouTube Public | PhD | Religious and Cultural Studies |
| Kumara, JDA | Nāgārjuna's Magnum Opus Mūlamadhyamakakārikā: A Derridean Deconstruction | PhD | Religious and Cultural Studies |
| Shi Daoxin Rev. | Venerable Fa Fang as a Modern Buddhist Visionary: A Critical Study of his thoughts and their influence on Buddhism in Modern China | PhD | Religious and Cultural Studies |
| Shafeega F | Farmer Adaptation to Climate Change: Case study of three communities in the Maldives | PhD | Social Sciences |
| Gunasekera VN | Political Vs Personal: The Discourse around the Eviction of the Northern Muslims in Sri Lanka | MPhil | Psychology, Philosophy and Education |

| | | | |
|---|---|---|---|
| Jayaweera JMK | Contemporary Sri Lankan Sexuality: A Philosophical Analysis | MPhil | Psychology, Philosophy and Education |
| Mendis G | Being with the Patient: An Existential Approach to a Meaningful Doctor Patient Relationship | MPhil | Psychology, Philosophy and Education |
| Wimaladhamma K, Rev. | Perceptions of People with Mental Disorders about their Mental Health Condition: An Exploratory Study | MPhil | Psychology, Philosophy and Education |
| Abeykoon AMSP | Parenting of Adolescent: An exploratory study of Parenting Styles | MPhil | Psychology, Philosophy and Education |
| Ekanayake LI | A qualitative study on factors associated with symptoms of elderly depression in Sri Lanka | MPhil | Psychology, Philosophy and Education |
| Durage UVN | A study on the effectiveness of an awareness program to improve preschool children's knowledge of child sexual abuse | MPhil | Psychology, Philosophy and Education |
| Premakumar PM | Evaluation of Flood Disaster and Impacts on Agriculture Sector in Batticaloa District (A Case Study on Porathivu Pattu D.S.D) | MPhil | Social Sciences |
| Udayanga, KAS | Fostering and Enabling Environment for Early Childhood Care and Education of the Estate Sector in Sri Lanka | MPhil | Social Sciences |
| Jeyatheeswaran G | Interactions between the Jaffna Kingdom and the Southern Kingdoms of Medieval Sri Lanka | MPhil | Social Sciences |
| Rathanasara K, Rev. | An Investigation into the Historical Usage of the "Jambudipa" Concept | MPhil | Social Sciences |
| Sandimar, Rev. | Pali Literature of Rāmaññadesa (A Historical Survey of Pali literature of Rāmaññadesa from the Sixth Century CE to the Fifteenth Century CE) | MPhil | Religious and Cultural Studies |
| Suriyadaza, Rev | A Critical Examination of Political Involvement of the Sangha in Modern Myanmar | MPhil | Religious and Cultural Studies |
| Sucata, Rev. | The Emergence and Expansion of Buddhism upto the 01st Century A.D. | MPhil | Religious and Cultural Studies |
| Piyananda, B. Rev. | A Comparative Study on Preaching Style of Dhammapadaṭṭhakathā and Saddharmarathnāvaliya | MPhil | Religious and Cultural Studies |
| Wajira K, Rev. | Style and Persuasion: A Buddhist Discourse Analysis within the Framework of the Milindapañha | MPhil | Religious and Cultural Studies |
| Xulong Lu | A Comparative Study of Western and Buddhist Epistemological Perspectives on Meditation | MPhil | Religious and Cultural Studies |

| | | | |
|---|---|---|---|
| Kularatne BA | An Investigative Study of Poverty Problem through Buddhist Perspective | MPhil | Religious and Cultural Studies |
| Kariyapperuma, KMDL | Variation Between the Little Tradition and the Great Tradition of the Literature reflected in Classical Sinhala Prose and the Sinhalese Diglossia (A Critical Study based on some selected Classical Sinhala Prose Works) | MPhil | Languages and Literature Studies |
| Panneerselvam M | Upcountry Tamil Novels: A Thematic Study from a Cultural Perspective | MPhil | Languages and Literature Studies |
| Indananda I. Rev. | Life of the Subaltern (non-elite) in British Colonial Sri Lanka as depicted in Modern Sinhala Novels with Historical Themes: A Critical Study | MPhil | Languages and Literature Studies |
| Lenaduwa L.L.Y.R. | Impact of Identity-based Motivation on Identity-based Consumer Behaviour and Purchase Intention: A study of Gem and Jewellery Industry in Sri Lanka | MPhil | Economics & Management |
| Li Xiao Fang, Rev. | A Study and Translation of the Scripture on Ten Reflections | MA | Religious and Cultural Studies |
| Chen Yuan, Rev. | A Study on the Education of Buddhist Nuns in Contemporary China | MA | Religious and Cultural Studies |
| Hao Yanbo, Rev. | A Comparative Study on the Formless Threefold Refuge Thought in the Platform Sutra by Zong Bao and the Three Refuges Thought in the Sutta Pitaka | MA | Religious and Cultural Studies |
| Shi Yanpeng, Rev. | Buddhist Principles Reflected in Shaolin Precepts | MA | Religious and Cultural Studies |
| Lin Jia Jia, Rev. | A Semantic Analysis of Rupa-Skandha in Abhidharmakosabhasya: Chinese Interpretations based on Chinese Masters Puguang and Fabao | MA | Religious and Cultural Studies |
| Suo Kaixin, Rev. | A Study of Holographic Cosmology in Ten Mysterious Gates Theory of Huayan Doctrines | MA | Religious and Cultural Studies |
| Shi Tongyi, Rev. | A Comparative Study of *Ānāpāsati* in the *Visuddhimagga* and the *Six Dhamma Gates to the Sublime* | MA | Religious and Cultural Studies |
| Zhen Yanfei, Rev. | A Study of Attendant's Rules of the Chan Sect in China | MA | Religious and Cultural Studies |
| Shi Youru, Rev. | A Study of the Bell and Signaling Board in the Chan Hall of Chinese Buddhist Monastery | MA | Religious and Cultural Studies |

| | | | |
|---|---|---|---|
| Jin Dou, Rev. | Some Debates on Lv Cheng's "One Hundred Reasons Why Sūragama Sūtra is Apocryphal" | MA | Religious and Cultural Studies |
| Shao Jinyue, Rev. | An Analytical Study of Pūrva-Pranidhāna in Sūtra on Merits of the Fundamental Vows of the Seven Buddhas of Lapis Lazuli Radiance Master of Healing | MA | Religious and Cultural Studies |
| Lin Pingping, Rev. | A Critical Analysis of the Doctrine of the Northern Chan School | MA | Religious and Cultural Studies |
| Zheng Huixin, Rev. | A Comparative Study of Transforming Consciousness into Wisdom in the Mahāyānasamgraha-Śāstra and the Vijnāptimātratāsiddhi - Śāstra | MA | Religious and Cultural Studies |

මූලාශ්‍රය: ලේඛකාධිකාරී කාර්යාලය, මානවශාස්ත්‍ර සහ සමාජීය විද්‍යා පශ්චාත් උපාධි ආයතනය

2022 දී, ආයතනය සිය 5 වැනි වාර්ෂික පර්යේෂණ සම්මේලනය දෙසැම්බර් 16 වැනි දින පේරාදෙණිය විශ්වවිද්‍යාලයේ උපකුලපති මහාචාර්ය එම්.ඩී. ලමාවංශ මහතාගේ ගෞරවනීය සහභාගිත්වයෙන් ආයතන ශ්‍රවණාගාරයේදී සාර්ථකව පවත්වන ලදී. න්‍යායාත්මක දැනුමෙන් ප්‍රායෝගිකත්වයට අධ්‍යාපන ක්‍රමවේදය පරිවර්තනය වීමත් සමඟ සිසුන්ගේ පර්යේෂණ කුසලතා වැඩිදියුණු කිරීම මත පදනම්ව පශ්චාත් උපාධි සිසුන්ට ඔවුන්ගේ පර්යේෂණ අත්දැකීම් බෙදා ගැනීමට පුළුල් ඉඩක් විවර කිරීමට අප ආයතනයට හැකිවිය. මේ හරහා පර්යේෂණ සිසුන්ගේ නිර්මාණාත්මක පර්යේෂණ දැනුම බෙදා හැරීමට සහ ඒවා ප්‍රකාශනයට පත් කිරීමට ඔවුන්ට අවස්ථාව සලසා දී ඇත. PGIHS-RC 2022 සඳහා වියුක්ත ලිපි ඉදිරිපත් කිරීම් 92 ක් ලැබුණු අතර ඉන් ලිපි 65ක් පර්යේෂණ සම්මේලනයේ දී ඉදිරිපත් කිරීම් සඳහා තෝරාගත් අතර ඉන් පසු ඒවා පර්යේෂණ සම්මේලන නිබන්ධයෙහි ප්‍රකාශයට පත් කරන ලදී.



ආයතනය සිය ප්‍රථම ශාස්ත්‍රීය ජර්නලය 2017 වර්ෂයේදී ආරම්භ කලේය. මෙම ද්විවාර්ෂික පර්යේෂණ ජර්නලයේ/ මානවශාස්ත්‍ර හා සමාජීය විද්‍යා ජර්නලයේ (JHS) ප්‍රධාන අරමුණ වන්නේ මානවශාස්ත්‍ර හා සමාජීය විද්‍යා පශ්චාත් උපාධි ආයතනයේ ශිෂ්‍යයින්ට සහ අනෙකුත් පර්යේෂකවරුන්ට තම පර්යේෂණ ක්‍රියාකාරකම් පිළිබඳ වාර්තා පල කිරීමට අවස්ථාව සලසා දීමයි. මානවශාස්ත්‍ර හා සමාජීය විද්‍යා පශ්චාත් උපාධි ආයතනයේ පර්යේෂණ සමුළුවේ දී පර්යේෂණ පත්‍රිකා ඉදිරිපත් කරන පර්යේෂකයින්ට ද තම පර්යේෂණ පත්‍රිකා මෙම ජර්නලයේ පල කිරීමට හැකියාව තිබේ. 2018 වර්ෂයේදී මානව ශාස්ත්‍ර හා සමාජීය විද්‍යා ජර්නලයේ කාණ්ඩ 02 ක් ආයතනය විසින් පල කරන ලදී. සමස්ත පර්යේෂණ පත්‍රිකා 10 ක් හා පොත් පිළිබඳ වූ විචාර **02** ක් ජර්නලයේ I වන වෙළුමේ I හා II කාණ්ඩයන්හි පල කරන ලදී. පර්යේෂණ පත්‍රිකා පහක් සහ පොත් පිළිබඳ වූ විචාර දෙකක් ඇතුළත්ව මානවශාස්ත්‍ර හා සමාජීය විද්‍යා ජර්නලයේ (JHS) **2** වන වෙළුමේ I කාණ්ඩය **2019** වර්ෂයේ අග භාගයේ දී පල කරන ලදී. පර්යේෂණ ලිපි **6** ක් හා පොතක් පිළිබඳ වූ විචාරයක් සහිතව **2** වන වෙළුමේ II කාණ්ඩය පලකරන ලදි. මානවශාස්ත්‍ර හා සමාජීය විද්‍යා ජර්නලයේ ප්‍රකාශිත පත්‍රිකා හා උක්ත විචාරයන් උසස් මට්ටමේ පවතින අතර විශේෂයෙන් ම අදාළ ක්ෂේත්‍රයන්හී යොවුන් පර්යේෂකයින්ට ඉතා ප්‍රයෝජනවත් වේ. **2020** වසරේදි තෙවෙනි වෙලුමේ I කාණ්ඩය යටතේ ලිපි **7**ක් හා ග්‍රන්ථ විචාරයක්ද III වෙළුමේ **2** වන කාණ්ඩය යටතේ, Covid -19 සඳහා විශේෂිත ලිපි **6**ක්ද පලකෙරිණි.




ඵලදායී සහ ඉහළ මට්ටමකින් යුත් පර්යේෂණ පවත්වා ගෙන යාමටත් ඒවා පල කිරීමට හා ඉදිරිපත් කිරීමට අවස්ථාව සලසමින් පශ්චාත් උපාධි සිසුන් විසින් ආරම්භ කරන ලද පර්යේෂණ කටයුතු දිරිමත් කිරීමට සහ ඒ සඳහා සහාය ලබා දීම පිණිස වැඩි වැඩියෙන් සම්පත් සහ පහසුකම් සලසා දීම කෙරෙහි ආයතනය සිය අවධානය යොමු කරයි. දේශීය සහ/ හෝ විදේශීය පුද්ගලයින්, කණ්ඩායම් සහ කීර්තිමත් සංවිධාන සමඟ උසස් අධ්‍යාපනය සහ පර්යේෂණ සම්බන්ධයෙන් ඵලදායී සම්බන්ධතා ගොඩ නඟා ගනිමින් පර්යේෂණ සහ සංවර්ධන කාර්යයන් හි ආයතනය දැනට නියැළී සිටින ප්‍රමාණය තවදුරටත් පුළුල් කිරීමට එම ප්‍රයත්නය මඟින් අපේක්ෂා කරයි. උපාධි පාඨමාලාවල ගුණාත්මකභාවය තවදුරටත් ඉහළ නැංවීම පිණිස අමාත්‍යාංශ, දෙපාර්තමේන්තු සහ නියෝජිත ආයතන, රාජ්‍ය නොවන සංවිධාන, පෞද්ගලික අංශය සහ අනෙකුත් උසස් අධ්‍යාපන හා පුහුණු කිරීමේ ආයතන වැනි දේශීය ආයතන සමඟ සබඳතා සහ සහයෝගීතා ස්ථාපිත කිරීමද සිදු කරනු ලබයි.

## 9 කොටස | සාමාන්‍ය උපාධි ප්‍රදානෝත්සවය හා ඩිප්ලෝමා ප්‍රදානෝත්සවය

පැවති කොවිඩ් 19 වසංගත තත්ත්වය හේතුවෙන් 2022 වසර සඳහා පේරාදෙණිය විශ්වවිද්‍යාලය මඟින් පවත්වනු ලබන වාර්ෂික උපාධි ප්‍රදානෝත්සවය සහ ආයතනය මඟින් පවත්වනු ලබන ඩිප්ලෝමා ප්‍රදානෝත්සවය නොපැවැත්විණි.

## 10 කොටස | ධාරිතාව සංවර්ධනය

ඒ වන විට රට තුළ උද්ගතව පැවති අර්බුධකාරී තත්ත්වය හමුවේ වුවද අප ආයතනයේ ලියාපදිංචි වූ සිසුන්ගේ අධ්‍යාපන කටයුතු අඛණ්ඩව කරගෙන යෑමේ වගකීම පිළිබඳව අපගේ දැඩි අවධානය යොමු විය. ඒ අනුව භෞතික පංතිකාමර අධ්‍යාපන ක්‍රමවේදය වෙනුවට මාර්ගගත අධ්‍යාපන ක්‍රමවේදයකට

යොමු වූ අප ඒ සඳහා අවශ්‍ය යටිතල පහසුකම් 2021 වසර තුළ දීම සම්පාදනය කර ගැනීමට සමත් විය. ඒ අනුව පංතිකාමර තුළ ස්මාර්ට් ඉගෙනුම් පුවරු සවි කිරීම, පරිගණක මිලදී ගැනීම, වේගවත් අන්තර්ජාල පහසුකම් ලබා දීම 2021 වසරේ දී අප විසින් සිදු කර අවසන් කරන ලදී. රටේ පැවතින ආර්ථික අර්බුදයත් සමඟ සාමාන්‍ය පරිදි අපගේ වැඩකටයුතු සහ අධ්‍යයන ක්‍රියාවලිය සිදුකිරීමට අපගේ ආයතනයට අවශ්‍ය නව ජනක යන්ත්‍රය සඳහා MIS වෙතින් අවසර ලබා ගැනීමට අපට හැකි විය.

| 11 කොටස | තිරසාර සංවර්ධනය මත පදනම් වූ අනාගත අපේක්ෂිත වාර්තාව |
|---|---|

ආයතනය විසින් දැනට මෙහෙයවනු ලබන ඉගැන්වීමේ හා පර්යේෂණ වැඩසටහන් සහ පාඨමාලා සංවර්ධනය 2018 අංක 19 දරන විගණන පනතේ III වන කොටසේ අංක 17 (ඇ) යටතේ දක්වා ඇති තිරසර සංවර්ධන පිළිබඳ සියලු අරමුණු වලට අනුකූලව සිදු වේ. එසේම ආයතනය විසින් දැනට සිදුකරගෙන යන පර්යේෂණ කටයුතු විශේෂයෙන්ම පහත දැක්වෙන තිරසාර අරමුණු වලට අනුගත වන අතර (අරමුණු 1, 2, 3, 4, 5, 6, 8, 9, 10, 12, 13, 15 සහ 16) ආයතනයේ නව අධ්‍යයන වැඩසටහන් සහ පාඨමාලා සංවර්ධනය විශේෂයෙන් පහත දැක්වෙන අරමුණුවලට අනුගත වේ. අරමුණු 1, 4, 5, 11, 13, 15 සහ 16.

ආයතනයේ තිරසාර සංවර්ධන අරමුණු ලඟා කරගැනීම සම්බන්ධව කෙටුම්පත් කළ සැලැස්ම ආයතනයේ කළමනාකරණ කමිටුව මේ වනවිට අනුමත කර ඇති අතර එහිදී හඳුනාගන්නා වෙනස්කම් සහිතව සැලැස්ම නැවත වැඩිදියුණු කිරීමේ කටයුතු කළමනාකරණ මණ්ඩල සාමාජිකයින් දෙදෙනෙකුගෙන් යුත් අනු කමිටුවක් මඟින් මේ වන විට සිදු කරගෙන යනු ලබයි. ආයතනය මේ වනවිට තිරසාර සංවර්ධන අරමුණු ලඟා කරගැනීම සම්බන්ධ සැලැස්මේ කටයුතු සිදුකරගෙන යනු ලබයි.

මානවශාස්ත්‍ර හා සමාජීය විද්‍යා පශ්චාත් උපාධි ආයතනය තිරසාර අරමුණු වලට අනුගතව මෑතකදී හඳුන්වාදුන් නව පාඨමාලා වලට උදාහරණ ලෙස පහත වැඩසටහන් දැක්විය හැක.

1. පරිසර කළමනාකරණය පිළිබඳ පශ්චාත් උපාධිය
2. තිරසර සංචාරක සංවර්ධන පශ්චාත් උපාධිය
3. මානව හිමිකම් හා බහුසංස්කෘතිවාදය පිළිබඳ පශ්චාත් උපාධිය
4. ප්‍රජා සංවර්ධනය පිළිබඳ පශ්චාත් උපාධි ඩිප්ලෝමාව

මෙයට අමතරව වෙනත් පශ්චාත් උපාධි වැඩසටහන් පරිසර කළමනාකරණය, ආපදා කළමනාකරණය, ජල සම්පත් සුරක්ෂණය, බලශක්ති සම්පත් ආදි විෂයයන් පිළිබඳ දැනුම හා පුහුණුව ලබාදේ.

එමෙන්ම ආයතනය ආපදා කළමනාකරණය පිළිබඳ කෙටි කාලීන ආපදා වැඩසටහන් හඳුන්වාදීමේ හා ධාරිතා සංවර්ධන ව්‍යාපෘතියක් ක්‍රියාත්මක කරයි. ආයතනය විසින් පේරාදෙණිය විශ්වවිද්‍යාලයෙහි ක්‍රියාදාමයන්ට අනුගතව විදුලිය පරිහරණය, ජල පරිහරණය, කසල බැහැර කිරීම හා පරිසර සංරක්ෂණ යනාදි වැඩසටහන් ක්‍රියාත්මක කිරීම හරහා තිරසාර සංවර්ධන අරමුණු සාක්ෂාත් කරගැනීම සඳහා දායකත්වය ලබාදේ.

| 12 කොටස | දේශීය විදේශීය සහයෝගිතාව |
|---|---|

ජාතික භාෂා සමානාත්මතා අභිවෘද්ධි ව්‍යාපෘතිය **(NLEAP)**

ජාතික භාෂා සමානාත්මතා අභිවෘද්ධි ව්‍යාපෘතිය (NLEAP) කැනඩා රජය විසින් අරමුදල් සපයනු ලබන Alinea International සංවිධානය විසින් ක්‍රියාවට නංවා ඇති අතර මේ හරහා භාෂා අයිතිය ප්‍රයෝජනයට ගනිමින් සංහිඳියාව, ජාතික සමගිය සහ සාමය සහ ආරක්ෂාව පෝෂණය කිරීම සඳහා ශ්‍රී ලාංකීය අභිලාෂයන්ට සහාය වීමට කැනඩාවේ කැපවීම නියෝජනය කරයි. රාජ්‍ය භාෂා ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීම තුළින් ව්‍යවස්ථාපිත භාෂාමය අයිතිවාසිකම් ප්‍රගතිශීලී ලෙස සමානාත්මතාවෙන් යුතුව සාක්ෂාත් කර ගැනීම සඳහා ශ්‍රී ලංකා රජය සිය කැපවීම ඵලදායි ලෙස යොදා ගන්නා ආකාරය පිළිබඳ ප්‍රවාහයන් සපයයි.
මෙම ව්‍යාපෘතිය මගින් අප ආයතනයට "ශ්‍රී ලංකාවේ බහු සංස්කෘතික සමාජය තුළ භාෂා ප්‍රතිපත්තිය ඵලදායී ලෙස ක්‍රියාත්මක කිරීමේ දී ඒ කෙරෙහි බලපාන දේශපාලනික, සංස්කෘතික සහ ආයතනික යන

සාධක පිළිබඳ අධ්‍යයනයක්'' යන මැයෙන් පර්යේෂණ ව්‍යාපෘතියක් සිදු කිරීම සඳහා ප්‍රදානයක් පිරිනමා ඇත.

ව්‍යාපෘතියේ සමස්ත අරමුණ

**"ශ්‍රී ලංකාව වැනි බහු භාෂා හා බහු සංස්කෘතික සමාජයක,ප්‍රජාවගේ යහපත උදෙසා භාෂාමය භාවිතයන්ගේ දීමතු වන ගැටුම්වල ස්වභාවයන් හා අන්තර්ගතයන් පිළිබඳව,ශාස්ත්‍රීයව පිළියම් සෙවීමට හා දැනුම බෙදාහැරීම සම්බන්ධව ශ්‍රී ලංකා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ සාර්ථක භාෂා ප්‍රතිපත්ති ක්‍රියාත්මක කිරීමට අවශ්‍ය දැනුම අවබෝධ කර ගැනීම හා ගෙනහැර දැක්වීමමෙම ව්‍යවස්ථාවේ සමස්ත අරමුණ වේ."**

මෙය භාෂා අයිතිය ප්‍රවර්ධනය පිළිබඳ වසරක ව්‍යාපෘතියකි. මෙම ව්‍යාපෘතියේ ව්‍යාපෘති සම්බන්ධීකාරක ලෙස කටයුතු කරනු ලබන්නේ පේරාදෙණිය විශ්වවිද්‍යාලයේ ශාස්ත්‍ර පීඨයේ දේශපාලන විද්‍යා අංශයේ මහාචාර්ය ජී.ඩී.ආර්.යූ.යූ අබේරත්න මහතා වන අතර පේරාදෙණිය විශ්වවිද්‍යාලයේම මහාචාර්ය ජේ.එම්.ඒ. ජයවික්‍රම, මහාචාර්ය ඒ.එම්.එන්. බණ්ඩාර, ආචාර්ය ආර්. රමේෂ්, ආචාර්ය එස්.බාස්කරන් සහ රුහුණු විශ්වවිද්‍යාලයේ ආචාර්ය ඩබ්ලිව්.එම්.රොහාන් ලක්සිරි සහ ආචාර්ය සුරංජිත් ගුණසේකර මෙම ව්‍යාපෘතියේ අනෙකුත් පර්යේෂකයන් ලෙස කටයුතු කරයි. මෙම ව්‍යාපෘතියේ සමස්ත අධීක්ෂණය සහ ඇගයීම පේරාදෙණිය විශ්වවිද්‍යාලයේ මානව ශාස්ත්‍ර හා සමාජ විද්‍යා පශ්චාත් උපාධි ආයතනයේ අධ්‍යක්ෂ වන මහාචාර්ය එස්.ජේ.එස්. ද මෙල් මහතා විසින් මෙහෙය වනු ලබයි.



ශ්‍රී ලංකාවේ මධ්‍යම, දකුණ, උතුර සහ බස්නාහිර පළාත් පදනම් කර ගනිමින් මෙම ව්‍යාපෘතිය සඳහා දත්ත රැස් කිරීම සිදු කර ඇති අතර ග්‍රාමීය ප්‍රජාවන්, ප්‍රාදේශීය සුළුතර ප්‍රජාවන්, යුද්ධයෙන් පීඩාවට පත් වූවන්, කාන්තාවන්, තරුණයින් හා විශේෂ අවස්ථාවන් ඇති රජයෙන් ප්‍රතිලාභ ලබන්නන් සම්බන්ධව මෙහි දී විශේෂ අවධානය යොමු කර ඇත.



2022 වසරේ අවසන් මාස කිහිපය තුළ මෙම ව්‍යාපෘතියේ වැඩකටයුතු සියයට 80කින් පමණ අවසන් කර ඇත. ව්‍යාපෘති කණ්ඩායම ශ්‍රී ලංකාවේ නාගොඩ, මීගමුව, වවුනියාව සහ කොත්මලේ යන අධ්‍යයන ප්‍රදේශවල නියැදිය සමඟ සාකච්ඡා සහ සම්මුඛ පරීක්ෂණ අවසන් කර ඇත.තවද, ඔවුන් එම ප්‍රදේශනලදී ම ප්‍රශ්නාවලිය සමීක්ෂණ ද සම්පූර්ණ කරන ලදී. ව්‍යාපෘති කණ්ඩායම මේ වන විට පර්යේෂණයට අදාළව ප්‍රකාශයට පත් කිරීමට නියමිත පර්යේෂණ කෘතියෙහිපළමු පරිච්ඡේද තුන මේ වන විට සම්පූර්ණ කර ඇත.

## 13 කොටස | සාමාන්‍ය පරිපාලනය

මෙහෙයුම් කටයුතු හා සම්බන්ධ කළමනාකරණ හා ක්‍රියාවලියේ අඩුපාඩු / ගැටලු පිළිබඳ අවධානය යොමු කරමින් සාමාන්‍ය පරිපාලනය විධිමත් කිරීම සඳහා ආයතනය විසින් ක්‍රියාමාර්ග ගනු ලැබීය. 2022 වර්ෂය තුළදී ආයතනයේ විගණන සහ කළමනාකරණ කමිටුව තුන්වරක් හා මුදල් කමිටුව සිව්වරක් රැස්වුණ. ආයතනය විසින් ස්ථාවර වත්කම් ලේඛනය සහ වත්කම් සැසඳුම් පිළියෙල කිරීමේ කටයුතු ද නිම කරන ලදී. ආයතනයේ ඉන්වෙන්ටර පොත පිළියෙල කිරීම වසර අවසානයේදී සම්පූර්ණ කරන ලද අතර, වත්කම්වල අගය සැසඳීමේ ක්‍රියාවලිය ද සම්පූර්ණ කරන ලදී.

කෙසේ වෙතත්, ආයතනය එහි දුර්වල ක්‍රියාකාරී ක්ෂේත්‍ර වැඩිදියුණු කිරීමට සහ එය අත්පත් කරගත් ස්ථානය තහවුරු කිරීමට තවදුරටත් අවශ්‍ය ක්‍රියාමාර්ග ක්‍රියාත්මක කළේය. ආයතනයේ ප්‍රගතිය තවදුරටත් වර්ධනය කර ගැනීම සඳහා 2022 වර්ෂය තුළදී ආයතනය හැකි සෑම විටම කළමනාකරණ මණ්ඩලය, අධ්‍යයන මණ්ඩල සහ අනුකමිටු වැනි තීරණ ගැනීමේ ආයතනවල රැස්වීම් පවත්වන ලදී. එහි ප්‍රතිඵලයක් ලෙස රටේ පවතින ආර්ථික අර්බුදයත් සමඟ සාමාන්‍ය පරිදි අපගේ වැඩකටයුතු සහ අධ්‍යයන ක්‍රියාවලිය සිදුකිරීමට අපගේ ආයතනයට අවශ්‍ය නව ජනක යන්ත්‍රය සඳහා MIS වෙතින් අවසර ලබා ගත හැකි විය. 2022 වර්ෂයේදී, යාවත්කාලීන කරන ලද IQAC ඒකකය තවදුරටත් වැඩිදියුණු කිරීම සඳහා IQAC (අභ්‍යන්තර තත්ත්ව සහතික පද්ධතිය) සම්බන්ධීකාරකයෙකු බඳවා ගන්නා ලද අතර එමඟින් අභ්‍යන්තර තත්ත්ව සහතික කිරීමේ යාන්ත්‍රණය සැකසීමට සහ එමඟින් ආයතනයෙහි සියලුම මූලික ක්‍රියාකාරිත්වයේ ගුණාත්මකභාවය අඛණ්ඩව වැඩිදියුණු කිරීමට අපට හැකි විය.

## 14 කොටස | මූල්‍ය කාර්යසාධනය

මෙම කොටස මඟින් 2022 වර්ෂයේ දී ආයතනයේ මූල්‍ය කාර්යසාධනය පිළිබඳ තොරතුරු ඉදිරිපත් කෙරේ. 11 වැනි වගුවෙන් 2021 වර්ෂයේ හා 2022 වර්ෂයේදී ආයතනයේ මෙහෙයුම් ආදායම, මෙහෙයුම් වියදම සහ අතිරික්තය පිළිබඳ තොරතුරු නිරූපණය කෙරේ. ආයතනයේ මෙහෙයුම් ආදායම ශිෂ්‍යයින්ගෙන් ලබා ගන්නා ගාස්තු, පොළී ආදායම් සහ භාණ්ඩාගාරයෙන් ලැබෙන පුනරාවර්තන ප්‍රදානවලින් සමන්විත වේ. ආයතනයේ මෙහෙයුම් ආදායම 2021 වර්ෂයේදී රුපියල් මිලියන157.312 සිට 2022 වර්ෂයේදී රුපියල් මිලියන 169.106 දක්වා රුපියල් මිලියන 49 කින්ඉහළ ගොස් ඇත.

වගු අංක 11
ආයතනයේ මෙහෙයුම් ආදායම, වියදම සහ අතිරික්තය (2021 සහ 2022 වර්ෂ සඳහා)


| ආදායම / වියදම | 2021 | | 2022 | |
|---|---|---|---|---|
| | **Rs.** | **%** | **Rs.** | **%** |
| **මෙහෙයුම් ආදායම** | | | | |
| අභ්‍යන්තර ආදායම් (පාඨමාලා ගාස්තු ලියාපදිංචි, අධ්‍යයන, විභාග සහ පොලී ආදායම්) | 133,852,761.84 | 85.09 | 149,452,107.34 | 88.37 |
| පුනරාවර්තන ප්‍රදාන | 23,200,000.00 | 14.75 | 19,654,000.00 | 11.63 |
| රජයේ ප්‍රදානක්‍රමක්ෂය | 259,408.74 | 0.16 | -- | -- |
| ***මුළු මෙහෙයුම් ආදායම්*** | **157,312,170.58** | **100.00** | **169,106,107.34** | **100.00** |
| | | | | |
| **මෙහෙයුම් වියදම** | | | | |
| පුද්ගල පඩිනඩි | 58,047,112.46 | 58.12 | 69,777,746.43 | 62.64 |
| ගමන් වියදම් | 34,300.00 | 0.25 | 40,000.00 | 0.04 |
| සැපයුම් සහ පාරිභෝජ්‍ය ද්‍රව්‍ය | 1,844,746.05 | 3.28 | 2,113,789.75 | 1.89 |
| නඩත්තු | 590,807.00 | 0.26 | 920,230.00 | 0.82 |

| | | | | |
|---|---|---|---|---|
| ගිවිසුම්ගත සේවා | 8,605,754.68 | 11.94 | 9,221,306.92 | 8.28 |
| ක්ෂය | 9,043,168.60 | 8.83 | 9,213,012.38 | 8.28 |
| වෙනත් පුනරාවර්තන වියදම් | 9,829,602.53 | 17.33 | 20,111,529.59 | 18.05 |
| ***මුළු මෙහෙයුම් වියදම්*** | **87,995,491.32** | **100.00** | **111,397,615.07** | **100.00** |
| | | | | |
| **ශුද්ධ අතිරික්තය** | **69,316,679.26** | **100.0** | **70,034,596.34** | **100.00** |

සටහන: ශුද්ධ අතිරික්තය මුළු මෙහෙයුම් ආදායමේ ප්‍රතිශතයක් ලෙස
මූලාශ්‍රය : මානවශාස්ත්‍ර හා සමාජීය විද්‍යා පශ්චාත් උපාධි ආයතනයේ මූල්‍ය අංශය

10 වැනි වගුව සහ 4 වැනි ප්‍රස්ථාරය මඟින් ආයතනයේ මෙහෙයුම් පිරිවැය පිළිබඳ තොරතුරු ද නිරූපණය කෙරේ. පුද්ගල පඩිනඩි ගෙවීම්, ගිවිසුම්ගත සේවා සහ අනෙකුත් පුනරාවර්තන වියදම් ආයතනයේ මෙහෙයුම් පිරිවැයේ ප්‍රධාන සංරචකයන් වේ. පුද්ගල පඩිනඩි ගෙවීම් යන්නට ස්ථිර පරිපාලන කාර්ය මණ්ඩලය සහ කොන්ත්‍රාත් කාර්ය මණ්ඩලය සඳහා වැටුප් සහ වේතන, බාහිර කථිකාචාර්ය ගාස්තු, අධීක්ෂණ ගාස්තු යනාදිය ඇතුළත් වේ. ගිවිසුම්ගත සේවා යන්නට ආරක්ෂක සේවා, පිරිසිදු කිරීමේ සහ පවිත්‍රතා සේවා සඳහා ගෙවීම්, වාහන කුළී, දුරකථන සන්නිවේදන සහ අන්තර්ජාල සේවා යනාදිය ඇතුළත් වේ. 2022 වර්ෂයේ දී ආයතනයේ මෙහෙයුම් වියදම රුපියල් මිලියන 111.397 ක් වන අතර, එය 2021 වර්ෂයේ වාර්තා වූ රුපියල් මිලියන 87.995 ක වියදමට වඩා රුපියල් මිලියන 21% කින් වැඩි වී ඇත.ආයතනයේ කර්තව්‍යයන් සහ මෙහෙයුම් පුළුල් වීම එහි මෙහෙයුම් පිරිවැය වැඩිවීම සඳහා හේතු වී තිබුණි.

ප්‍රස්ථාර අංක 4
2022 වර්ෂයේ මෙහෙයුම් පිරිවැයේ ප්‍රතිශතක ව්‍යාප්තිය




2021 වර්ෂය තුළ දී ආයතනය රුපියල් මිලියන 57.708 ක ශුද්ධ අතිරික්තයක් වාර්තා කරන ලදී. 2022 වර්ෂයේ දී ආයතනයේ ශුද්ධ අතිරික්තය රුපියල් මිලියන 69.316.ක් දක්වා රුපියල් මිලියන 11.6 කින් ඉහළ ගොස් ඇත.

ආයතනයේ 2021 වර්ෂයේ හා 2022 වර්ෂයේ මූල්‍ය තත්ත්වය 12 වන වගුව මඟින් නිරූපණය කෙරේ. ආයතනයේ ශුද්ධ වත්කම සහ හිමිකම 2021 වර්ෂයේදී රුපියල් මිලියන 286.582 ක සිට 2022 වර්ෂයේ දී රුපියල් මිලියන 352.427 ක් දක්වා ඉහළ ගොස් ඇත. ආයතනය 2021 සහ 2022 යන වර්ෂයන් තුළ එහි මෙහෙයුම් කටයුතුවලදී මනා මූල්‍ය කාර්යසාධනයක් සහ මූල්‍ය තත්ත්වයක් අත්කරගෙන ඇති බව ඉහත කරුණු අනුව පිළිබිඹු වේ. තවද, සමුච්චිත අතිරික්ත අරමුදල් නව අධ්‍යයන හා පරිපාලනමය හැකියාවන් ගොඩනැගීම සඳහා යොදා ගැනීමටත් සිසුන්ට වැඩි පහසුකම් හා දිරිගැන්වීම් ලබා දීමටත් ආයතනයේ කළමනාකරණ මණ්ඩලය තීරණය කර තිබේ. ශිෂ්‍යත්ව යෝජනා ක්‍රම නිර්මාණය කිරීම සහ පර්යේෂණ ප්‍රදාන යෝජනා ක්‍රමය ස්ථාපිත කිරීම මගින් සිය පර්යේෂණ හැකියාවන් වැඩි දියුණු කිරීම සඳහා මෙම අතිරික්ත අරමුදල් භාවිතා කිරීමටද ආයතනය සැලසුම් කරයි

වගු අංක 12
2021 සහ 2022 වර්ෂයේ ආයතනයේ මූල්‍ය තත්ත්වය (දෙසැම්බර් 31 දිනට)

| අයිතමය | 2021 | 2022 |
|---|---|---|
| | රුපියල්. | රුපියල්. |
| වත්කම් | | |
| ජංගම වත්කම් | 281,716,184.89 | 349,310,627.66 |
| ජංගම නොවන වත්කම් | 32,599,413.96 | 46,985,808.29 |
| මුළු වත්කම් | **314,315,598.85** | **396,296,435.95** |
| | | |
| වගකීම් | | |
| ජංගම වගකීම් | 23,955,294.12 | 39,583,094.62 |
| ජංගම නොවන වගකීම් | 3,009,886.00 | 4,285,717.00 |
| මුළු වගකීම් | **26,965,180.12** | **43,868,811.62** |
| ශුද්ධ වත්කම් | **287,350,418.73** | **352,427,624.33** |
| | | |
| හිමිකම් | | |
| ප්‍රාග්ධන අරමුදල් | 20,813,086.62 | 27,812,282.48 |
| සමුච්චිත අරමුදල් | 166,951,371.08 | 242,510,984.50 |
| අනෙකුත් හිමිකම් සංරචක | 16,036,807.83 | 16,571,224.08 |
| අතිරික්තය | 70,034,596.34 | 57,708,492.27 |
| ප්‍රදාන - මිනාන් බෞද්ධ විද්‍යාලය | 6,999,195.86 | -- |
| පරිත්‍යාග ස්ථාවර වත්කම් | 6,515,361.00 | 7,824,641.00 |
| ශුද්ධ හිමිකම් | **287,350,418.73** | **352,427,624.33** |

මූලාශ්‍රය : මානවශාස්ත්‍ර හා සමාජීය විද්‍යා පශ්චාත් උපාධි ආයතනයේ මූල්‍ය අංශය

## 16 කොටස | විභවතා සහ අපේක්ෂා

පවත්නා පාඨමාලා සඳහා වන ප්‍රවේශය තවදුරටත් පුළුල් කරමින් සහ අන්තර් විෂයික සහ බහු විෂයීක සංකල්පය තුළ නව පාඨමාලා හඳුන්වා දෙමින් පශ්චාත් උපාධි පාඨමාලා පුළුල් කිරීමට සහ විවිධාංගිකරණය කිරීමට ආයතනය සැලසුම් කරයි. සංයුක්ත සැලැස්මේ හඳුන්ගෙන ඇති පරිදි සහ අවශ්‍යතා මතුවන පරිදි නව උපාධි පාඨමාලා සකස් කිරීමේ කාර්යයෙහි ආයතනය අඛණ්ඩව නියැලී සිටී. එමෙන්ම පෞද්ගලික හා රාජ්‍ය ආයතනවල සහයෝගයෙන් යුතුව ශ්‍රම බලකාය සඳහා කෙටි කාලීන පාඨමාලා පැවැත්වීම ද ආයතනය විසින් සිදු කරනු ලබයි.

ආයතනය පොදුවේ තම ශිෂ්‍යයින්ගේ සහ අනෙකුත් පිරිසගේ පර්යේෂණ සහ කාර්ය ධාරිතාවය සංවර්ධනය කිරීම උදෙසා වාර්ෂික සමුළු, පරිසංවාද, වැඩමුළු සහ පුහුණු සැසි අඛණ්ඩව පවත්වයි. මානවශාස්ත්‍ර හා සමාජීය විද්‍යා පශ්චාත් උපාධි ආයතනයේ ජර්නලයේ තම පර්යේෂණ ප්‍රකාශන එල කිරීම සඳහා පශ්චාත් උපාධි ශිෂ්‍යයින් සහ පර්යේෂකයින් උනන්දු කරවීම ද සිදු කෙරේ.

ඵලදායී සහ ඉහළ මට්ටමකින් යුත් පර්යේෂණ පවත්වාගෙන යාමටත් ඒවා පල කිරීමට හා ඉදිරිපත් කිරීමට අවස්ථාව සලසමින් පශ්චාත් උපාධි සිසුන් විසින් ආරම්භ කරන ලද පර්යේෂණ දිරිමත් කිරීමට සහ ඒ සඳහා සහාය ලබා දීම පිණිස වැඩි වැඩියෙන් සම්පත් සහ පහසුකම් සලසා දීම කෙරෙහි ආයතනය සිය අවධානය යොමු කරයි. දේශීය සහ/ හෝ විදේශීය පුද්ගලයින්, කණ්ඩායම් සහ කීර්තිමත් සංවිධාන සමඟ උසස් අධ්‍යාපනය සහ පර්යේෂණ සම්බන්ධයෙන් ඵලදායී සම්බන්ධතා ගොඩ නඟා ගනිමින් පර්යේෂණ සහ සංවර්ධන කාර්යයන් හි ආයතනය දැනට නියැලී සිටින ප්‍රමාණය තවදුරටත් පුළුල් කිරීමට එම ප්‍රයත්නයෙන් අපේක්ෂා කරයි. උපාධි පාඨමාලාවල සහ පර්යේෂණවල ගුණාත්මකභාවය තවදුරටත් ඉහළ නැංවීම පිණිස අමාත්‍යාංශ, දෙපාර්තමේන්තු සහ නියෝජිත ආයතන, රාජ්‍ය නොවන සංවිධාන, පෞද්ගලික අංශය සහ අනෙකුත් උසස් අධ්‍යාපන හා පුහුණු කිරීමේ ආයතන වැනි දේශීය ආයතන සමඟ සබඳතා සහ සහයෝගීතා ස්ථාපිත කිරීමද සිදු කරනු ඇත. විදේශ ආයතන සමඟ සබඳතා සහ සහයෝගීතා ගොඩනැඟීම ආයතනයට තම පාඨමාලා ජාත්‍යන්තරීකරණය කිරීම සඳහා මඟ පාදන අතර විදෙස් පුහුණු සඳහා අවස්ථා උදා කර ගැනීමට එහි සිසුන්ට අවස්ථාව සැලසේ. 2018-22 කාලපරිච්ඡේදය සඳහා වන සංයුක්ත සැලැස්ම සහ ඒ අනුව පිළියෙල කරනු ලබන ක්‍රියාකාරී සැලසුම් සාර්ථකව ක්‍රියාත්මක කිරීම මඟින් ආයතනය මෙරටේ මෙන්ම කලාපයේ උසස් අධ්‍යාපන හා පර්යේෂණ ක්ෂේත්‍රයේ ප්‍රමුඛස්ථානයට ඔසවා තැබීමට අපේක්ෂා කෙරේ.

ජාතික විගණන කාර්යාලය
தேசிய கணக்காய்வு அலுவலகம்
NATIONAL AUDIT OFFICE

මගේ අංකය / எனது இல. / My No. } [illegible]/2023/[illegible]    ඔබේ අංකය / உமது இல. / Your No. }    දිනය / திகதி / Date } 2023 මැයි 22 දින

අධ්‍යක්ෂ,

මානව ශාස්ත්‍ර හා සමාජ විද්‍යා පශ්චාත් උපාධි ආයතනය.

**මානව ශාස්ත්‍ර හා සමාජ විද්‍යා පශ්චාත් උපාධි ආයතනයේ 2022 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන සහ වෙනත් නෛතික හා නියාමන අවශ්‍යතා පිළිබඳව 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 වන වගන්තිය ප්‍රකාරව විගණකාධිපති වාර්තාව**

---

සහතික කරන ලද ගිණුම සහ යථෝක්ත වාර්තාව මේ සමඟ එවා ඇත.

ඩබ්ලිව්.එම්.පී.ඒ.ෆොන්සේකා

නියෝජ්‍ය විගණකාධිපති

විගණකාධිපති වෙනුවට

පිටපත් :- 01. ලේකම් - අධ්‍යාපන අමාත්‍යාංශය

02. ලේකම් - මුදල්, ආර්ථික ස්ථායීකරණ සහ ජාතික ප්‍රතිපත්ති අමාත්‍යාංශය

03. සභාපති - විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව

04. උපකුලපති - පේරාදෙණිය විශ්වවිද්‍යාලය

අංක 306/72, පොල්දූව පාර, බත්තරමුල්ල, ශ්‍රී ලංකාව.    No. 306/72, Polduwa Road, Battaramulla, Sri Lanka.
+94 11 2 88 70 28 - 34    +94 11 2 88 72 23    ag@auditorgeneral.gov.lk    www.naosl.gov.lk

ජාතික විගණන කාර්යාලය
தேசிய கணக்காய்வு அலுவலகம்
NATIONAL AUDIT OFFICE

මගේ අංකය / எனது இல. / My No. } පීපීඑජ්/එච්ඩී/බී/පීජීඅයිඑච්එස්/2022/ ඔබේ අංකය / உமது இல. / Your No. } දිනය / திகதி / Date } 2023 මැයි /෴ දින

අධ්‍යක්ෂ

මානව ශාස්ත්‍ර හා සමාජ විද්‍යා පශ්චාත් උපාධි ආයතනය

මානව ශාස්ත්‍ර හා සමාජ විද්‍යා පශ්චාත් උපාධි ආයතනයේ 2022 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන සහ වෙනත් නෛතික හා නියාමන අවශ්‍යතා පිළිබඳව 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 වන වගන්තිය ප්‍රකාරව විගණකාධිපති වාර්තාව

---

## 1. මූල්‍ය ප්‍රකාශන

### 1.1 තත්ත්වාගණනය කළ මතය

මානව ශාස්ත්‍ර හා සමාජ විද්‍යා පශ්චාත් උපාධි ආයතනයේ 2022 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය, හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන්, සාරාංශගත වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්තිවලින් සමන්විත 2022 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ සහ 1971 අංක 38 දරන මුදල් පනතේ විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව ප්‍රකාරව මාගේ වාර්තාව යථා කාලයේදී පාර්ලිමේන්තුවේ සභාගත කරනු ලැබේ.

මාගේ වාර්තාවේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම කොටසේ විස්තර කර ඇති කරුණුවලින් වන බලපෑම හැර, මානව ශාස්ත්‍ර හා සමාජ විද්‍යා පශ්චාත් උපාධි ආයතනයේ මූල්‍ය ප්‍රකාශන තුළින් 2022 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරිත්වය හා මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

### 1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

(අ) සමාලෝචිත වර්ෂය තුළ ලැබී තිබුණු රු.1,309,280 ක පරිත්‍යාග ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත 11 ප්‍රකාරව ගිණුම්ගත කර නොතිබුණි.

(ආ) ඉකුත් වර්ෂයේ ක්ෂය වෙන් කිරීම් වැඩිපුර සටහන් කිරීමේ වරද සමාලෝචිත වර්ෂය තුළ නිවැරදි කිරීමේදී සමුච්චිත අරමුදලට හා සමුච්චිත ක්ෂය ගිණුමට දෝෂ සහිත ලෙස පිළිවෙලින් හර හා බැර කිරීම හේතුවෙන් සමුච්චිත අරමුදල් ශේෂය හා සමුච්චිත ක්ෂය ගිණුම රු.514,315 කින් පිළිවෙලින් අඩුවෙන් හා වැඩියෙන් දක්වා තිබුණි.

අංක 306/72, පොල්දූව පාර, බත්තරමුල්ල, ශ්‍රී ලංකාව. இல. 306/72, பொல்தூவ வீதி, பத்தரமுல்லை, இலங்கை. No. 306/72, Polduwa Road, Battaramulla, Sri Lanka.
+94 11 2 88 70 28 - 34 +94 11 2 88 72 23 ag@auditorgeneral.gov.lk www.naosl.gov.lk

(ඇ) පශ්චාත් උපාධි පාඨමාලා සම්පූර්ණ කිරීමට ලබා දී ඇති උපරිම කාල පරිච්ඡේදය තුළ පාඨමාලා ගාස්තු ආදායම් අදාල වර්ෂයේ ආදායමක් ලෙස හඳුනා ගැනීම හා එම උපරිම කාලසීමාව තුළ අයනොවූ ආදායම් ලියාහැරීම ආයතනයේ ප්‍රතිපත්තිය වුවද, පාඨමාලාවන් 09 කට අදාළව එම කාලසීමාව තුළ නොලැබුණු රු.11,119,837 ක පාඨමාලා ගාස්තු ආදායම් ලියා හැරීමකින් තොරව මූල්‍ය ප්‍රකාශනවල ජංගම වත්කම් යටතේ දක්වා තිබුණි.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම්, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම් යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

## 1.3 ආයතනයේ 2022 වාර්ෂික වාර්තාවේ ඇතුළත් අනෙකුත් තොරතුරු

මෙම විගණන වාර්තාවේ දිනට පසුව මට ලබාදීමට බලාපොරොත්තු වන මානව ශාස්ත්‍ර හා සමාජ විද්‍යා පශ්චාත් උපාධි ආයතනයේ 2022 වාර්ෂික වාර්තාවේ ඇතුලත් කර ඇති නමුත් මූල්‍ය ප්‍රකාශන සහ ඒ පිළිබඳව වූ මාගේ විගණන වාර්තාවේ ඇතුළත් නොවන තොරතුරු, අනෙකුත් තොරතුරු යන්නෙන් අදහස් වේ. මෙම අනෙකුත් තොරතුරු සඳහා කළමනාකරණය වගකිව යුතුය.

මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් වූ මාගේ මතයෙන් අනෙකුත් තොරතුරු ආවරණය නොකරන අතර මම ඒ පිළිබඳ කිසිදු ආකාරයක සහතිකවීමක් හෝ මතයක් ප්‍රකාශ නොකරමි.

මූල්‍ය ප්‍රකාශන පිළිබඳ මාගේ විගණනයට අදාළව, මාගේ වගකීම වන්නේ ඉහත හඳුනාගත් අනෙකුත් තොරතුරු ලබාගත හැකි වූ විට කියවීම සහ එසේ කිරීමේදී අනෙකුත් තොරතුරු මූල්‍ය ප්‍රකාශන සමඟ හෝ විගණනයේදී හෝ වෙනත් ආකාරයකින් ලබාගත් මාගේ දැනුම අනුව ප්‍රමාණාත්මක වශයෙන් නොගැලපෙනවාද යන්න සලකා බැලීමයි.

මානව ශාස්ත්‍ර හා සමාජ විද්‍යා පශ්චාත් උපාධි ආයතනයේ 2022 වාර්ෂික වාර්තාව කියවන විට, එහි ප්‍රමාණාත්මක වරදවා දැක්වීම් ඇති බව මම නිගමනය කළහොත්, නිවැරදි කිරීම සඳහා පාලනය කරන පාර්ශවයන් වෙත එම කරුණු සන්නිවේදනය කළ යුතුය. තව දුරටත් නිවැරදි නොකළ වරදවා දැක්වීම් තිබේ නම්, ඒවා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව ප්‍රකාරව මා විසින් යථා කාලයේදී පාර්ලිමේන්තුවේ සභාගත කරනු ලබන වාර්තාවට ඇතුළත් කරනු ඇත.

## 1.4 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ කළමනාකරණයේ සහ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම්

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී, ආයතනය අඛණ්ඩව පවත්වාගෙන යාමේ හැකියාව තීරණය කිරීම කළමනාකරණයේ වගකීමක් වන අතර, කළමනාකාරිත්වය ආයතනය ඈවර කිරීමට අදහස් කරන්නේ නම් හෝ වෙනත් විකල්පයක් නොමැති විටදී මෙහෙයුම් නැවැත්වීමට කටයුතු කරන්නේ නම් හැර අඛණ්ඩ පැවැත්මේ පදනම මත ගිණුම් තැබීම හා

ආයතනයේ අඛණ්ඩ පැවැත්මට අදාළ කරුණු අනාවරණය කිරීමද කළමනාකරණයේ වගකීමකි.

ආයතනයේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධව පරීක්ෂා කිරීමේ වගකීම, පාලනය කරන පාර්ශවයන් විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) උප වගන්තිය ප්‍රකාරව, ආයතනයේ වාර්ෂික සහ කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

## 1.5 මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා ,සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සෑම විටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මකභාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කර ගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දූස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.
- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවූවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදී.
- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය, ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.
- සිද්ධීන් හෝ තත්ත්වයන් හේතුවෙන් ආයතනයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ ප්‍රමාණාත්මක අවිනිශ්චිතතාවයක් තිබේද යන්න සම්බන්ධයෙන් ලබාගත් විගණන සාක්ෂි මත පදනම්ව ගිණුම්කරණය සඳහා ආයතනයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ පදනම් යොදා ගැනීමේ අදාලත්වය තීරණය කරන ලදී. ප්‍රමාණවත් අවිනිශ්චිතතාවයක් ඇති බවට මා නිගමනය කරන්නේ නම් මූල්‍ය ප්‍රකාශනවල ඒ සම්බන්ධයෙන් වූ හෙළිදරව්කිරීම් වලට මාගේ විගණන වාර්තාවේ අවධානය යොමු කළ යුතු අතර, එම හෙළිදරව්කිරීම් ප්‍රමාණවත් නොවන්නේ නම් මාගේ මතය විකරණය කළ යුතුය.

කෙසේ වුවද, අනාගත සිද්ධීන් හෝ තත්ත්වයන් මත අඛණ්ඩ පැවැත්ම අවසන් විමට හැකිය.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුලත්ව ඇති බව සහ හෙළිදරව්කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ත ඉදිරිපත් කිරීම අගයන ලදී.

මාගේ විගණනය තුළදී හදුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව පාලනය කරනු ලබන පාර්ශවයන් දැනුවත් කරමි.

## 2. වෙනත් නෛතික හා නියාමන අවශ්‍යතා පිළිබඳ වාර්තාව

**2.1** 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ පහත සඳහන් අවශ්‍යතාවයන් සම්බන්ධයෙන් විශේෂ ප්‍රතිපාදන ඇතුළත් වේ.

**2.1.1** මාගේ වාර්තාවේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම කොටසේ විස්තර කර ඇති කරුණුවලින් වන බලපෑම හැර, 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12(අ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවන් අනුව, විගණනය සඳහා අවශ්‍ය සියලු තොරතුරු සහ පැහැදිලි කිරීම් මා විසින් ලබාගන්නා ලද අතර, මාගේ පරීක්ෂණයෙන් පෙනී යන ආකාරයට නිසි මූල්‍ය වාර්තා ආයතනය පවත්වාගෙන ගොස් තිබුණි.

**2.1.2** 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6(1)(ඈ)(iii) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව ආයතනයේ මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වේ.

**2.1.3** 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6(1)(ඈ)(iv) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව ඉකුත් වර්ෂයේදී මා විසින් සිදුකරන ලද නිර්දේශයන් ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත්ව ඇත.

**2.2** අනුගමනය කරන ලද ක්‍රියාමාර්ග සහ ලබා ගන්නා ලද සාක්ෂි මත හා ප්‍රමාණාත්මක කරුණුවලට සීමා කිරීම තුළ, පහත සඳහන් ප්‍රකාශ කිරීමට තරම් කිසිවක් මාගේ අවධානයට ලක් නොවීය.

**2.2.1** 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 (ඈ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව ආයතනයේ පාලක මණ්ඩලයේ යම් සාමාජිකයෙකුට ආයතනය සම්බන්ධවී යම් ගිවිසුමක් සම්බන්ධයෙන් සෘජුව හෝ අනාකාරයකින් සාමාන්‍ය ව්‍යාපාරික තත්ත්වයෙන් බැහැරව සම්බන්ධයක් ඇති බව.

**2.2.2** 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12(ඊ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව පහත සඳහන් නිරීක්ෂණය හැර යම් අදාළ ලිඛිත නීතියකට හෝ ආයතනයේ පාලක මණ්ඩලය විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානවලට අනුකූල නොවන ලෙස ක්‍රියා කර ඇති බව.

| නීතිරීති/ විධානයට යොමුව | නිරීක්ෂණ |
| --- | --- |
| (අ) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය | |

4

| | |
|---|---|
| 2021 නොවැම්බර් 16 දිනැති අංක PE/01/2021 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ 6.6. ඡේදය | මුදල් වර්ෂය අවසන්වී මාස 05 ක් ඇතුළත ආයතනයේ විගණිත වාර්තාව සමඟ කාර්යසාධනය ඇතුළත් වාර්ෂික වාර්තාව භාෂා ත්‍රිත්වයෙන් පාර්ලිමේන්තුවේ සභාගත කළයුතු වුවත්, ආයතනය විසින් 2020 හා 2021 වර්ෂවලට අදාළ වාර්ෂික වාර්තා මේ දක්වාම පාර්ලිමේන්තුවේ සභාගත කර නොතිබුණි. |

**2.2.3** 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 ( උ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව ආයතනයේ බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූල නොවන ලෙස කටයුතු කර ඇති බව.

| බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට යොමුව | නිරීක්ෂණ |
|---|---|
| (අ) 1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනතේ 25 වන වගන්තිය | ආයතනය විසින් පවත්වාගෙන යනු ලබන පශ්චාත් උපාධි පාඨමාලා 54 ක් සඳහා සමාලෝචිත වර්ෂය අවසන් වන විටත් විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ අනුමැතිය ලබා ගෙන නොතිබුණි. |
| (ආ) විශ්වවිද්‍යාල අධ්‍යයන කාර්යය මණ්ඩලයේ ආචාර ධර්ම හා අධ්‍යයන වගකීම් පිළිබඳ මාර්ගෝපදේශ සංග්‍රහය - 2015 - මාර්ගෝපදේශ 25 | ආචාර්ය මණ්ඩලය හා ශිෂ්‍යයින් අතර ද්වි සම්බන්ධතාවයක් ඇති වීමේ තත්ත්වයන් අනාවරණය කර ගැනීම සඳහා විධිමත් ක්‍රමවේදයක් ආයතනය විසින් ක්‍රියාත්මක කර නොතිබුණි. |
| (ඇ) 2016 මාර්තු 01 දිනැති අංක 04/2016 දරන විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභා චක්‍රලේඛය | |
| i. 4.5 ඡේදය | 2018 වර්ෂයේ සිට 2020 වර්ෂය දක්වා කාලය තුළ ක්‍රියාත්මක කරන ලද පාඨමාලා 20 කට අදාලව අයවැයගත එකතු ආදායම රු.308,973,800 ක් සම්බන්ධයෙන් එම පාඨමාලා අවසානයේ දී මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට කටයුතු කර නොතිබුණි. |
| ii. 2 හා 4.5 ඡේද | ශූන්‍ය පදනම (Zero Base)යටතේ ස්වයං මූල්‍ය උත්පාදන ක්‍රියාකාරකම් පවත්වාගෙන යා යුතු බවට දක්වා තිබියදීත්, 2018 ජනවාරි 01 දින සිට |

5

2022 ඔක්තෝම්බර් 31 දින දක්වා කාලය තුළ ක්‍රියාත්මක කරන ලද ස්වයං මූල්‍ය උත්පාදන ක්‍රියාකාරකම් තුළින් ලද ආදායමින් රු.185,673,375 ක් අදාළ කාර්යයන් සඳහා යොදවා නොගෙන වාණිජ බැංකු 03 ක ස්ථාවර තැන්පතු යටතේ ආයෝජනය කර තිබුණි.

2.2.4 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12(උ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව ආයතනයේ සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාල සීමාවන් තුළ අදාළ නීතිරීති වලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර නොමැති බව.

2.3 වෙනත් කරුණු

(අ) අනුමත සේවක සංඛ්‍යාව ඉක්මවා කොන්ත්‍රාත් පදනම මත සේවකයින් 20 දෙනෙකු බඳවාගෙන සමාලෝචිත වර්ෂය තුළ රු. 9,087,356 ක වැටුප් හා දීමනා ගෙවා තිබුණි.

(ආ) ආයතනයේ පිවිසුම් මාර්ගය පුළුල් කිරීමට සහ වාහන නවතා තැබීමට ගරාජයක් හා පැති බැම්මක් ඉදිකිරීම සඳහා 2019 පෙබරවාරි 28 දින රු.4,666,843 කට ගිවිසුම්ගතව 2019 මැයි.27 දින වන විට වැඩ අවසන් කිරීම සඳහා ඉදිකිරීම් කොන්ත්‍රාත්කරුවෙකු වෙත පවරා තිබුණ ද ගිවිසුම්ගත කාලය ඉකුත් වී වසර 3කට වඩා කාලයක්ගතවී තිබියදීත් සමාලෝචිත වර්ෂයේ අවසාන දින වන විටත් එහි වැඩ අවසන් කර නොතිබුණි.

(ඇ) University Network for Disaster Risk Reduction and Management in Indian Ocean ව්‍යාපෘතිය සැලසුම් කළ පරිදි ආරම්භ නොකිරීම හේතුවෙන් ඒ වෙනුවෙන් ලැබී තිබුණු ප්‍රදානවලින් 2021 වර්ෂයේදී මිලදී ගත් රු.6,271,631 ක උපකරණ වසරකට වැඩි කාලයක් නිෂ්කාර්යව පැවතුණි.

(ඈ) National Languages Equality Advancement Project (NLEAP) ව්‍යාපෘතිය 2022 ජනවාරි 01 සිට 2022 දෙසැම්බර් 31 දක්වා කාලය තුළ නිමකිරීම සඳහා රු.9,700,000 කට ගිවිසුම්ගතව තිබුණු අතර සමාලෝචිත වර්ෂය අවසාන දින වන විට රු.5,446,039 ක් වැය කර තිබුණි. ගිවිසුම්ගත කාලය ඉක්මවා තිබුණු එම ව්‍යාපෘතිය තුලින් අපේක්ෂිත අරමුණු කිසිවක් ඉටුවී නොතිබුණි.

(ඉ) ඉකුත් වර්ෂයට සාපේක්ෂව සමාලෝචිත වර්ෂයේදී පශ්චාත් උපාධි පාඨමාලා සඳහා සියයට 75 කින්, දර්ශනපති පාඨමාලා සඳහා සියයට 95 කින් සහ දර්ශන ආචාර්ය උපාධි පාඨමාලා සඳහා සියයට 83 කින් සිසුන් බඳවා ගැනීම අඩු වී තිබූ අතර විදේශ ශිෂ්‍යයින් බඳවා ගැනීම ද සියයට 33 කින් අඩු වී තිබුණි.

ඩබ්ලිව්.පී.සී. වික්‍රමරත්න

විගණකාධිපති

6

# POSTGRADUATE INSTITUTE OF HUMANITIES AND SOCIAL SCIENCES (PGIHS)

University of Peradeniya, Peradeniya 20400, Sri Lanka


2022 ජූනි 19

ජ්‍යෙෂ්ඨ සහකාර විගණකාධිපති,
සහකාර විගණකාධිපති කාර්යාලය,
දිස්ත්‍රික් මහලේකම් කාර්යාල ගොඩනැගිල්ල,
යටිනුවර වීදිය,
මහනුවර

<u>කේඩීඒ/ඩී/පීජීඅයිඑච්එස්/2023/08</u>

මානවශාස්ත්‍ර හා සමාජීය විද්‍යා පශ්චාත් උපාධි ආයතනයේ 2022 වර්ෂයට අදාලව සිදු කළ මූල්‍ය ප්‍රකාශන සහ වෙනත් නෛතික හා නියාමන අවශ්‍යතා පිළිබඳව 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 වන වගන්තිය ප්‍රකාරව අවසන් විගණකාධිපති වාර්තාව හා බැඳේ.

ඔබ විසින් ඉදිරිපත්කළ තොරතුරු විමසීම සම්බන්ධයෙන් තවදුරටත් කරුණු පැහැදිලි කිරීම සඳහා මෙම පිළිතුරු ඉදිරිපත් කරනු ලබන අතර පිළිතුරු සනාථ කිරීමට ප්‍රමාණවත් ලිපිලේඛන, වාර්තා සටහන් යනාදියෙහි පිටපත් මේ සමඟ අමුණා ඇත.

1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

(අ) ඔබගේ නිරීක්ෂණ අනුව පරිත්‍යාග වශයෙන් ලැබුණු රු. 1,309,280.00ක් වටිනා ස්ථාවර වත්කම් ශ්‍රී ලංකා රාජ්‍ය ගිණුම්කරණ ප්‍රමිත 11 අනුව මූල්‍ය ප්‍රකාශන වල ඉදිරිපත් කළ යුතුවුවත් 2022 වර්ෂය සඳහා මූල්‍ය ප්‍රකාශන පිළියෙළ කිරීමේදී අතපසු වීමකින් එය මඟහැරී ඇති අතර 2023 වර්ෂය සඳහා මූල්‍ය ප්‍රකාශන තුල නිවැරදි කිරීමට කටයුතු කරනු ලැබේ.

(ආ) ඔබගේ විගණන විමසුමහි දක්වා ඇති වැරදි ලෙස ගිණුම් ගත කර තිබුණු අංක PGIHS/JV/2022/44 දරන රු. 257,157.65 ජර්නලය මඟින් සිදු වී ඇති අතිරික්තතාවය හා ඌනතාවය 2023 ගිණුම් පිළියෙල කිරීමේදී නිවැරදි කිරීමට කටයුතු කරනු ලැබේ.

(ඇ) උපාධි පාඨමාලාව සම්පූර්ණ කිරීමට ලබා දී ඇති උපරිම කාල සීමාවෙන් පසුවද ක්‍රියාකාරී සිසුන් සිටින පාඨමාලා සඳහා ඔවුන් විසින් තවදුරටත් ලැබිය යුතු පාඨමාලා ගාස්තු ජංගම වත්කම් යටතේ ලැබිය යුතු පාඨමාලා ගාස්තු ලෙස දක්වා ඇත. 2023 වසර තුළ ඔවුන් පිළිබඳව නැවත සමාලෝචනය කර ඔවුන්ගෙන් ලැබිය යුතු පාඨමාලා ගාස්තු අයකර ගැනීමට හෝ ඔවුන්ගෙන් ලැබිය යුතු මුදල් ගිණුම් පොත්වලින් කපා හැරීමට කටයුතු කරනු ලැබේ.

2.2.2 පොදු හෝ විශේෂ විධාන වලට අනුකූල නොවන ලෙස ක්‍රියාකර ඇති බව

(අ) ආයතනයේ 2020 වර්ෂයේ වාර්ෂික වාර්තාව අධ්‍යාපන අමාත්‍යාංශය විසින් ලබා දුන් දිනය වන 2023 මාර්තු මස 29 වන දින පාර්ලිමේන්තුවේ සභාගත කිරීමට භාර දෙන ලදී. එසේම 2021වර්ෂය හා අදාළ හා අදාළ වාර්ෂික වාර්තාව 2021 නොවැම්බර් මස අධ්‍යාපන අමාත්‍යාංශය වෙත ඉදිරිපත් කළ අතර අමාත්‍යාංශය මඟින් 2021 දෙසැම්බර් 29 වන දින පෙන්වා දුන් අඩුපාඩු නිවැරදි කර භාෂා ත්‍රිත්වයට මේ වන විට පරිවර්තනය කර ඇත. අධ්‍යාපන අමාත්‍යාංශය මඟින් දැනුම් දෙනු ලබන දිනයකදී පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කිරීමට සූදානමව ඇත. (ඇමුණුම 01)




Office: +94812 068 363 Director: +94 812 068 364 SAR/AR: +94 812 388 957 SAB/AB: +94 812 068 361
Fax: +94 812 068 362 Web: pgihs.ac.lk email: info@pgihs.ac.lk

2.2.3 ආයතනයේ බලතල, කර්තව්‍ය හා කාරයන්ට අනුකූල නොවන ලෙස කටයුතු කර ඇති බව

(අ) 1978 අංක 16 දරන විශ්ව විද්‍යාල පනත
මෙම පාඨමාලාවන් විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව ආරම්භ වීමට ප්‍රථමව පේරාදෙණිය විශ්වවිද්‍යාලයේ සභාපති සභාවේ සහ පාලක සභාවේ අනුමැතිය සහිතව 1950 ගණන් වල ආරම්භ කර වරින් වර සංවර්ධනය කර පිරිනාමා ඇත. කෙසේ වුවත් විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ නිර්දේශයට අනුව මෙම පාඨමාලා සඳහා විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ අනුමැතිය ලබාගැනීමට මෙම පාඨමාලා පිලිබඳ තොරතුරු විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවට 2019 දෙසැම්බර් මස 4 වන දින ආයතනය විසින් යොමු කරන ලදී. මේ වන විට අදාළ පාඨමාලාවන් සමාලෝචනය කිරීම සඳහා විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ තත්ත්ව ආරක්ෂණ කවුන්සිලය (Quality Assurance Council) වෙත යොමු කර ඇති අතර තත්ත්ව ආරක්ෂණ කවුන්සිල මඟින් අදාළ අනුමැතීන් ලබා දීමට නියමිතව ඇත. (ඇමුණුම 02)

(ආ) ආචාර ධර්ම හා අධ්‍යයන වගකීම් පිලිබඳ මාර්ගෝපදේශ සංග්‍රහය 2015
මාර්ගෝපදේශ 25
ආචාර්ය මණ්ඩලය හා ශිෂ්‍යයන් අතර ද්වි සම්බන්ධතාවයක් නොපැවැත්විය යුතු බවට වන ප්‍රතිපත්තියක් පේරාදෙණිය විශ්වවිද්‍යාලය විසින් 2021 අප්‍රේල් 04 වන දිනදී හඳුන්වාදෙනු ලැබිණි. අදාළ ප්‍රතිපත්තිය ආයතනයේ කළමනාකරණ මණ්ඩලය විසින් ආයතනයේ සියලුම ආචාර්යවරුන්ටද අදාළ කරමින් 2021 දෙසැම්බර් 30 දින පැවති ආයතනයේ 41 වන කළමනාකරණ මණ්ඩල රැස්වීමේදී එය අනුමත කරනු ලැබිය.
මේ අනුව ආයතනය සිය ආචාර්ය මණ්ඩලය පත්කිරීමේදී ඔවුන්ට ලබා දෙනු ලබන පත්වීම් ලිපිය තුළ ශිෂ්‍යයන් අතර ද්වි සම්බන්ධතාවයක් නොපැවැත්විය යුතු බවට වන වගන්තීන් ඇතුලත් කර ඇත. (ඇමුණුම 03)

(ඇ) අංක 4/2016 දරන 2016 මාර්තු 1 දිනැති විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභා චක්‍රලේඛය

i. 4.5 ඡේදය
ආයතනය මඟින් සියළු අධ්‍යයන පාඨමාලා සඳහා වන වියදම් සටහන් කිරීම සඳහා එක් එක් පාඨමාලා සඳහා වෙන වෙනම පොත් පවත්වා ගෙන යන අතර එම එක් එක් පාඨමාලා සඳහා වන සියලු වියදම් ඒ ඒ සටහන් පොත් තුල වාර්තා වේ. එකී පාඨමාලාවන් වලට අදාල වියදම් අය වැය ලේඛන වල දක්වා ඇති වැය ශීර්ෂයන් අනුව වෙන් කර ඇති පිටුවල සඳහන් කරනු ලැබේ. මෙලෙස එක් එක් පාඨමාලාවන්ට අදාල වියදම් වෙන් වෙන්ව පවත්වා ගෙන යනු ලබන නිසා එම පාඨමාලාවන්ට අදාල වියදම් හදුනා ගැනීමට සහ එම පාඨමාලාවන්ට අදාල මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම සිදු කළ හැක. ඉදිරියේදි එක් එක් පාඨමාලාවන්ට අදාල මූල්‍ය ප්‍රකාශන එම පාඨමාලා අවසන් වන විට පිලියෙළ කිරීමට කටයුතු කරනු ලැබේ.

ii. 2 හා 4.5 ඡේද
පාඨමාලාවන් සඳහා ශිෂ්‍යයින් ලියාපදිංචි වන අවස්ථාවේදී මුදල් ගෙවන බැවින් එම කාලයේදි තාවකාලික මුදල් අතිරික්තයක් ආයතනය තුළ පවතී. එම අතිරික්ත මුදල් ආයතනයේ ජංගම ගිණුම තුළ පවත්වා ගෙන යා නොහැකි බැවින් එම මුදල කළමනාකරණ මණ්ඩලයේ අනුමැතියට යටත්ව කෙටි කාලීන ස්ථාවර තැන්පතුවල ආයෝජනය කොට ඇත.

2.2.4 ආයතනයේ සම්පත් සකසුරුවම් ලෙස කාර්යක්ෂම ලෙස සහ ඵලදායි ලෙස කාලසීමාවන් තුළ අදාළ නීති රීති වලට අනුකූලව ප්‍රසම්පාදනය භාවිත කර නොමැති බව

(අ) කොන්ත්‍රාත් පදනම මත ආයතනය සේවකයන් විසිදෙනෙකුගේ සේවය ලබාගන්නා බව සනාථයකි. ආයතනයට ඇතුලත් වන ශිෂ්‍යය සංඛ්‍යාව ඉහල යන විට සහ ආයතනික වැඩ කටයුතු පුළුල් වන විට ඒ අනුව සේවකයන් සේවයේ යෙදවිය යුතු වේ.
මානවශාස්ත්‍ර සහ සමාජීය විද්‍යා පශ්චාත් උපාධි ආයතනය විසින් වැඩිවන අවශ්‍යතාවයන්ට අනුරූපව නව තනතුරු හඳුනා ගත අතර ඒ අනුව විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව සහ කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව වෙත අවස්ථා කීපයකදීම සිය කාර්යමණ්ඩල තනතුරු අනුමත කරවා ගැනීම වෙනුවෙන් ඉල්ලීම් සිදු කර ඇත. (ඇමුණුම 05) නමුත් දැනට දැනට ඒ වෙනුවෙන් යහපත් ප්‍රතිචාරයක් අදාළ ආයතන වලින් ලැබී නොමැති අතර අදාළ තනතුරු අනුමත වී ආයතනය විසින් එම තනතුරු සඳහා ස්ථිර කාර්ය මණ්ඩලය බඳවා ගන්නා තෙක් විශ්වවිද්‍යාල කොමිෂන් සභා චක්‍රලේඛ 2016/04 අනුව ඉහත සේවකයන් කොන්ත්‍රාත් පදනම මත ආයතනයේ කළමනාකරණ මණ්ඩලයේ අනුමැතියට යටත්ව සේවයේ යොදවා ගැනීම ආයතනය සිදු කරනු ලබයි.

(ආ) ආයතනයේ පැති බැම්ම සහ පිවිසුම් මාර්ගය පුළුල් කිරීමේ කොන්ත්‍රාත්තුව ලබාගත් කොන්ත්‍රාත්කරුගේ වැඩ අධීක්ෂණය සිදු කරනු ලැබුවේ පේරාදෙණිය විශ්වවිද්‍යාලයේ වැඩ අංශය විසිනි. කොන්ත්‍රාත්කරු විසින් අදාළ කොන්ත්‍රාත්තුවේ කොටසක් නිම කර එම කොටස සඳහා බිල්පතක් 2019 අප්‍රේල් 02 වන දින ආයතනය වෙත යොමු කළ අතර එය මෙම ආයතනය විසින් 2019 අප්‍රේල් 06 දින විශ්වවිද්‍යාලයේ වැඩ ඉංජිනේරුවරයා වෙත යොමු කෙරිණි. නමුත් විශ්වවිද්‍යාලයේ වැඩ දෙපාර්තමේන්තුවේ පැවති පරිපාලනමය ගැටළු තත්වයන් නිසා කොන්ත්‍රාත්කරු විසින් සිදු කළ වැඩ ඇගයීමේ කටයුතු ප්‍රමාද වූ අතර (2019 අගෝස්තු 01 දින දක්වා) අමතර වැඩ කටයුතු වෙනුවෙන් ගෙවීම් අනුමත කිරීමද බොහෝ දිනකින් ප්‍රමාද විය. මෙම හේතු මත කොන්ත්‍රාත්කරුට මුදල් ගෙවීම ප්‍රමාද වූ අතර කොන්ත්‍රාත්කරු විසින් මෙම ගෙවීම් කටයුතු සිදු කරන තෙක් නැවත මෙම ව්‍යාපෘතියේ වැඩ ආරම්භ කිරීම ප්‍රමාද කරන ලදී. (අමතරව සිදුකළ වැඩකටයුතු සඳහා ගෙවීම් අනුමැතිය ලැබුණු දිනය 2019 දෙසැම්බර් 30). මෙම හේතු නිසා අදාළ කොන්ත්‍රාත්තුව නියමිත දිනට අවසන් කිරීමට නොහැකි විය. කෙසේ වෙතත් නව පරිපාලනයත් සමඟ වැඩ දෙපාර්තමේන්තුවේ පැවති ගැටළු තත්වයන් සමනය වූ අතර කොන්ත්‍රාත්කරුට අදාළ මූලික ගෙවීම සිදුකරන ලදී. කොන්ත්‍රාත්කරු විසින් නිම කරන ලද අමතර වැඩ කටයුතු අනුමත කිරීම සහ ඒ වෙනුවෙන් සිදු කළයුතු ගෙවීම් කටයුතු නිර්දේශ කිරීමද සිදු විය.
එසේම 2020 වර්ෂය තුල රටේ පැවති අයහපත් වාතාවරණය නිසාද මෙහි වැඩකටයුතු තව දුරටත් ප්‍රමාද වූ අතර කොන්ත්‍රාත්කරු විසින් අදාළ ගිවිසුම් සහ ඇපකර වල ගිවිසුම්ගත කාලයන් 2022 පෙබරවාරි 28 වන දින දක්වා දීර්ඝ කර කොන්ත්‍රාත්තුවේ ඉතිරි වැඩකටයුතු නැවත ආරම්භ කළ අතර 2022 පෙබරවාරි මස 12 වන දින වන විට කොන්ත්‍රාත්කරු ඔහුට අදාළ සියළු වැඩ කටයුතු අවසන් කරන ලදී. මේ වනවිට අදාළ බිල්පත් ගෙවීම සඳහා අවශ්‍යය කටයුතු සිදුකර ඇත. (ඇමුණුම 04)

(ඇ) UN4DRR ව්‍යාපෘතිය සඳහා 2021 වර්ෂයේ දෙසැම්බර් මස තුලදී රු. 6,271,361 ක් වටිනා උපකරණ අයිතමයන් මිලදී ගත් අතර එම උපකරණ භාවිත කරමින් ප්‍රථම දැනුම බෙදා හැරීමේ වැඩමුළුව 2023 අප්‍රේල් මස 07 වන දින පවත්වන ලද අතර දෙවන වැඩමුළුව 2023 අප්‍රේල් මස 28 වන දින පැවැත්වීමට මේ වනවිට සැලසුම් කර ඇත. එසේම ප්‍රථම සහතික පත්‍ර පාඨමාලාව 2023 මැයි මසදී ආරම්භ කිරීම සිදු කර ඇත. එසේම අදාළ උපකරණ භූගෝල විද්‍යා අධ්‍යයන අංශය මඟින් මෙහෙයවන අනෙකුත්උපාධි සහ පශ්චාත් උපාධි පාඨමාලවන් සඳහා යොදාගැනීමටද අදාල ව්‍යාපෘති භාර සම්බන්ධීකාරකතුමීය පියවර ගෙන ඇත.

(ඈ) NLEAP ව්‍යාපෘතිය ආරම්භ කිරීමට බලාපොරොත්තු වූයේ 2022 ජනවාරි 01 වනදා වුවත් මුදල් ලබා ගැනීමට ප්‍රමාද වීම නිසා එම ව්‍යාපෘතිය 2022 පෙබරවාරි 01 සිට ආරම්භ කර ඇත. මෙම ව්‍යාපෘතිය සම්පූර්ණයෙන්ම ක්‍රියාත්මක වනුයේ පර්යේෂණ ව්‍යාපෘතියක් ආකාරයට බැවින් ව්‍යාපෘතිය තුල පර්යේෂණ ක්ෂේත්‍රය වෙත ගොස් දත්ත එක්රැස් කිරීම විශාල වශයෙන් අන්තර්ගත වීම හා රට තුළ පැවති අස්ථාවර තත්වයන් හා පැවති ඉන්ධන අර්බුදය මත ප්‍රවාහන ගැටළු මතුවිය. කෙසේ වෙතත් ව්‍යාපෘතිය වෙනුවෙන් ලද රු. 5,874,000.00 කින් රු.5,710,701.09ක් වර්ෂය අවසන් විට උපයෝජනය කර ඇත. තවද මෙම ව්‍යාපෘතියේ කාලය 2023 ජූනි 30 දක්වා දීර්ඝ කිරීමට මේ වන විටත් අවශ්‍ය කටයුතු සිදු කර ඇති අතර මේ වන විට අදාළ ක්ෂේත්‍ර වෙත ගොස් දත්ත එක්රැස් කිරීම මේ වනවිට සහ දත්ත විශ්ලේෂණ වැඩ කටයුතු මේ වන විට අවසන්ව ඇති අතර ප්‍රතිපල සහිත අවසන් වාර්තාව සකස් කිරීමේ කටයුතු මේ වන විට සිදු කරමින් ඇත.

(ඉ) 2022 වර්ෂය තුලදී ශාස්ත්‍රපති උපාධි පාඨමාලා සඳහා 75%කින්ද දර්ශනවේදී පාඨමාලා සඳහා 95%කින්ද දර්ශනපති පාඨමාලා සඳහා 83%කින්ද සිසුන් ඇතුලත්වීම අඩුව තිබූ බව සත්‍යයකි. මෙයට හේතුව වන්නේ මෙයට පෙර වර්ෂයන් වලදී වර්ෂය මැද (ජූනි සිට දෙසැම්බර් දක්වා) අදාළ පාඨමාලාවන්ට සිසුන් ඇතුලත් කළද 2022 වර්ෂය සහ ඊට පෙර වර්ෂයන් වලදී රටේ පැවති තත්වය මත අදාළ සිසුන්ගේ පාඨමාලා කාලය දීර්ඝ කිරීමට ආයතනයට සිදු වූ අතර මේ හේතුව නිසා 2022 වර්ෂයට සිසුන් ඇතුලත් කිරීම 2023 ජනවාරි මස දක්වා කල් දැමීමට ආයතනයට සිදුවිමයි. මෙම හේතුවෙන් අදාළ සිසුන් ඇතුලත් කර ගැනීම 2023 වර්ෂයට අදාළ කර ගැනීමට සිදු විය.

අධ්‍යක්ෂ,
මානවශාස්ත්‍ර හා සමාජීය විද්‍යා පශ්චාත් උපාධි ආයතනය
Director
Postgraduate Institute of
Humanities and Social Sciences
University of Peradeniya.

පිටපත්:
1. ලේකම් - අධ්‍යාපන අමාත්‍යාංශය
2. ලේකම් - මුදල්, ආර්ථික ස්ථායීකරණ සහ ජාතික ප්‍රතිපත්ති අමාත්‍යාංශය
3. සභාපති - විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව
4. විගණන අධිකාරී - ජාතික විගණන උප කාර්යාලය, පේරාදෙණිය විශ්වවිද්‍යාලය